# මූල්‍ය ප්‍රකාශන
# Financial Statements

ඕනෑම ව්‍යාපාර ඒකකයක මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා පිළියෙල කරනු ලබන ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශ හෙවත් අවසාන ගිණුම් ලෙස හඳුන්වයි. ව්‍යාපාර ඒකකයක යථා තත්ත්වය පෙන්නුම් කරනු ලබන ප්‍රධානතම විඥාපන ප්‍රභවය ලෙස සැලකෙන මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරිපත් කරනු ලබන මූල්‍යමය තොරතුරු එම ව්‍යාපාර ඒකකය කෙරෙහි ඇල්මක් දක්වන සියලුම කණ්ඩායම්වලට ප්‍රයෝජනවත් වේ.

සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයකට අයත් සංරචක

1. ........................................................................................................ (Statement of Financial Position)

   කිසියම් දිනකට ව්‍යාපාරයක පවතින වත්කම්, වගකීම් හා හිමිකම් අතර වූ සම්බන්ධය නැතහොත් මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරනු ලබන ප්‍රකාශය යි.

2. ........................................................................................................................................................

   (Statement of Profit or Loss & Other Comprehensive Income)

   ගිණුම් කාලච්ඡේදය සඳහා ලාභදායකත්වය (උපයන ලද ලාභය / අලාභය) නැතහොත් කාර්ය සාධනය ගණනය කිරීමට සකස් කරන ප්‍රකාශය යි.

3. ........................................................................................................................ (Statement of Cash Flows)

   ගිණුම් කාලච්ඡේදය තුළ මුදල් හා මුදල් වලට සමාන දෑ ව්‍යාපාරය තුළට ගලා ආ ආකාරය හා එවැනි සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා ගිය ආකාරයන් පෙන්නුම් කරනු ලබන ප්‍රකාශනය වේ.

4. ........................................................................................................................................................

   (Statement of Changes in Equity)

   ගිණුම් කාලච්ඡේදය තුළ අයිතිකරුවන්ගේ හිමිකම වෙනස් වූ ආකාරය පෙන්නුම් කරන වාර්තාව යි.

5. ........................................................................................................................................................

   (Notes, Comprising Significant Accounting Policies and Other Explanatory Information)

   මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් අයිතම විස්තරාත්මකව පැහැදිලි කිරීමේ සටහන් අඩංගු වන ප්‍රකාශනය යි.

## ගිණුම්කරණ තොරතුරු සැපයීම පිළිබඳ වගකීම / මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

ව්‍යාපාරයකට අදාළ මූල්‍යමය තොරතුරු සපයනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන මගිනි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම් ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය හෝ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවට ආයතනයේ ක්‍රියාත්මක වන පාලන අධිකාරිය විසින් දැරිය යුතුය.

එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම දරණ අධ්‍යක්ෂකවරු හෝ පාලන අධිකාරියට අයත් නිලධාරීන් අදාළ වගකීම භාර ගනිමින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කළ යුතු වේ.

# වත්කම්
# Assets

- ....................................................................................................................................................
- ....................................................................................................................................................
- ....................................................................................................................................................

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වත්කම් පහත පරිදි වර්ග කරනු ලැබේ.

වත්කම් (Assets)

ජංගම වත්කම් | ජංගම නොවන වත්කම්

## ජංගම වත්කම්
## Current Assets

- සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය හෙවත් මෙහෙයුම් චක්‍රය තුළ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට තිබෙන හෝ
- මූලික වශයෙන් වෙළඳාම සඳහා තබාගෙන සිටින හෝ
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දින සිට මාස 12 ක් ඇතුළත උපලබ්ධි වනු ඇතැයි අපේක්ෂා කරන හෝ
- භාවිතය පිළිබඳ සීමාවන් හෝ තහනමක් නොමැති මුදල් සහ මුදල් හා සමාන දෑ හෝ ජංගම වත්කම් වේ.

  උදා: අමුද්‍රව්‍ය තොග, නොනිමි භාණ්ඩ තොග, නිමි භාණ්ඩ තොග, වෙළඳ ණයගැතියෝ, ඉදිරියට ගෙවූ වියදම්, මුදල් හා බැංකු ශේෂයන්

### අභ්‍යාසය 81

වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීමට සපුරාලිය යුතු නිර්ණායකයන් දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 02)

**(AAT - July 2017)**

## ජංගම නොවන වත්කම්
**Non Current Assets**

ආයතනය විසින් නැවත විකිණීමේ අරමුණක් නොමැතිව ව්‍යාපාරය තුල එක් ගිණුම් කාලච්ඡේදයකට වැඩි කාලයක් භාවිතා කිරීමේ අරමුණින් සහ අදාල දිගු කාලය තුල ආයතනයට ආර්ථිකමය ප්‍රතිලාභ ප්‍රවාහය වේ යැයි අරමුණින් තබා ගන්නා වත්කම් ය.

උදා: ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, දිගුකාලීන ආයෝජන

# වගකීම්
# Liabilities

- ........................................................................................................................................................
- ........................................................................................................................................................
  ........................................................................................................................................................
- ........................................................................................................................................................
  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී වගකීම් පහත පරිදි වර්ග කරනු ලැබේ.

වගකීම් (Liabilities)
- ජංගම වගකීම්
- ජංගම නොවන වගකීම්

## ජංගම වගකීම්
**Current Liabilities**

- සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය හෙවත් මෙහෙයුම් චක්‍රය තුළ නිරාකරණය කිරීමට අපේක්ෂිත හෝ
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට මාස 12 ක් ඇතුළත නිරාකරණය කළ යුතුව තිබෙන හෝ
- මූලික වශයෙන්ම වෙළඳාම් කටයුතු කිරීම නිසාම හටගත් හෝ
- අදාළ වගකීම් මාස 12කට වඩා වැඩි කාලයක් විලම්භනය කිරීමට (පමා කිරීමට) හැකියාව නොමැති වගකීම් වේ.

  උදා: වෙළඳ ණයහිමියෝ, උපචිත මෙහෙයුම් වියදම්, බැංකු අයිරාව, කලින් ලද ආදායම්, ගෙවිය යුතු ආදායම් බදු

## ජංගම නොවන වගකීම්
**Nun-Current Liabilities**

ජංගම වගකීම් වල ඇතුළත් ලක්ෂණ අඩංගු නොවන දිගුකාලීන ස්වභාවයක් ගන්නා වගකීම් ජංගම නොවන වගකීම් වේ.

උදා: දිගුකාලීන බැංකු ණය, ණයකර, කල්බදු, ණයහිමියෝ

**සිරස් ක්‍රමය යටතේ පිළියෙල කරනු ලබන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආකෘතිය:**

ABC ව්‍යාපාරය
2017 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශය

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් | | | | xxx |
| අඩුකලා: | ආපසු එවුම් | | | (xxx) |
| | | | | xxx |
| අඩුකලා: | <u>විකුණුම් පිරිවැය</u> | | | |
| | ආරම්භක තොගය | | xxx | |
| | ගැණුම් | xxx | | |
| | අඩුකලා: ආපසු යැවුම් | (xxx) | | |
| | | xxx | | |
| | එකතුකලා: ගෙන ඒමේ කුලී | xxx | | |
| | ආයාත තීරුබදු | xxx | | |
| | ගොඩබෑමේ කුලී | xxx | xxx | |
| | | | xxx | |
| | අඩුකලා: භාණ්ඩ ගැනිලි | xxx | | |
| | හානි වූ තොග | xxx | (xxx) | |
| | | | xxx | |
| | අඩුකලා: අවසාන තොගය | | (xxx) | xxx |
| දළ ලාභය | | | | xxx |
| එකතුකලා: | <u>වෙනත් ආදායම්</u> | | | |
| | ලැබූ වට්ටම් | | xxx | |
| | පොලී ආදායම් | | xxx | |
| | ගෙවල්කුලී ආදායම් | | xxx | |
| | ආයෝජන ආදායම් | | xxx | |
| | අඩමාන ණය අධි වෙන්කිරීම | | xxx | |

| | | | | |
|---|---|---|---|---|
| | දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ | | xxx | xxx |
| | | | | xxx |
| අඩුකලා: | <u>බෙදාහැරීමේ වියදම්</u> | | | |
| | ප්‍රචාරණය | xxx | | |
| | ගෙන යාමේ කුලී | xxx | | |
| | දුන් වට්ටම් | xxx | | |
| | බොල්ණය | xxx | | |
| | අඩමාන ණය | xxx | | |
| | බෙදාහැරීමේ රථ ක්ෂය | xxx | xxx | |
| | <u>පරිපාලන වියදම්</u> | | | |
| | කුලී හා වරිපනම් | xxx | | |
| | විදුලිය ගාස්තු | xxx | | |
| | රක්ෂණ ගාස්තු | xxx | | |
| | වැටුප් හා වේතන | xxx | | |
| | කාර්යාල වියදම් | xxx | | |
| | ගොඩනැගිලි අලුත්වැඩියාව | xxx | | |
| | ගොඩනැගිලි ක්ෂය | xxx | | |
| | ගෘහභාණ්ඩ ක්ෂය | xxx | xxx | |
| | <u>වෙනත් වියදම්</u> | | | |
| | තොග කපා හැරීම් | xxx | | |
| | තොග හානි | xxx | | |
| | දේපළ, පිරියත හා උපකරණ පරිත්‍යාග විකිණීමේ අලාභ | xxx | xxx | |
| | <u>මූල්‍ය වියදම්</u> | | | |
| | ණය පොලී | xxx | | |
| | අයිරා පොලී | xx | | |
| | බැංකු ගාස්තු | xxx | xxx | (xxx) |
| ශුද්ධ ලාභය | | | | xxx |

**සිරස් ක්‍රමය යටතේ පිළියෙල කරනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක දල ආකෘතිය:**

ABC ව්‍යාපාරයේ
2017 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **ජංගම නොවන වත්කම්** | පිරිවැය | සමුඃක්ෂය | ශුද්ධ අගය |
|---|---|---|---|
| ඉඩම් | xxx | | xxx |
| ගොඩනැගිලි | xxx | (xxx) | xxx |
| යන්ත්‍ර උපකරණ | xxx | (xxx) | xxx |
| මෝටර් වාහන | xxx | (xxx) | xxx |
| කාර්යාල උපකරණ | xxx | (xxx) | xxx |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | xxx | (xxx) | xxx |
| | xxx | (xxx) | xxx |
| කීර්තිනාමය | | | xxx |
| ආයෝජන | | | xxx |
| ස්ථාවර තැන්පත් | | | xxx |
| ස්වාධිකාර හා වෙළෙඳ ලකුණු | | | xxx |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | xxx | |
| වෙළෙඳ ණයගැතියෝ / වෙළෙඳ ලැබිය යුතු දෑ | xxx | | |
| අඩුකලා: අඩමාන ණය වෙන්: | (xxx) | xxx | |
| ඉදිරියට ගෙවූ වියදම් | | xxx | |
| ලැබියු යුතු ආදායම් | | xxx | |
| බැංකු ශේෂය | | xxx | |
| අතැති මුදල් | | xxx | xxx |
| **මුළු වත්කම්** | | | xxx |
| | | | |
| **හිමිකම හා වගකීම** | | | |
| ප්‍රාග්ධනය | | | |
| 2016.04.01 දිනට ශේෂය | | | xxx |
| එකතුකලා: ශුද්ධ ලාභය | | | xxx |
| | | | xxx |
| අඩුකලා: ගැනිලි (මුදල් / භාණ්ඩ) | | | (xxx) |
| 2017.03.31 දිනට ශේෂය | | | xxx |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගුකාලීන බැංකු ණය | | xxx | |
| උකස් ණය | | xxx | xxx |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ණයහිමියෝ / වෙළෙඳ ගෙවිය යුතු දෑ | | xxx | |
| උපචිත වියදම් | | xxx | |
| කලින් ලද ආදායම් | | xxx | |
| ගෙවිය යුතු බිල්පත් | | xxx | |
| බැංකු අයිරාව | | xxx | xxx |
| **මුළු හිමිකම හා වගකීම** | | | xxx |

# ගැලපිලි සටහන්
## Adjusting Entries

ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන් වාර්ථා කරනු ලබන්නේ මුදල් පදනම (Cash Basis) යටතේ ය. නමුත් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා යොදා ගන්නේ උපචිත පදනම (Accrual Basis) ය. මේ අනුව මුදල් පදනම යටතේ වාර්ථා කර ඇති ගණුදෙනු හා සිද්ධීන් උපචිත පදනමට පරිවර්ථනය කිරීම සඳහාත් දැනට වාර්ථා කර නැති මුදල්මය නොවන ගණුදෙනු (උදා : ඉතිරි තොගය, ක්ෂයවීම්, බොල් හා අඩමාණ ණය) වාර්ථා කිරීම සඳහාත් තබා ගන්නා සටහන් ගැලපිලි සටහන් (Adjusting Entries) හෙවත් තුලන දින ගැලපීම් යනුවෙන් හඳුන්වයි. ගැලපිලි සටහන් පළමුව පොදු ජර්නලයේ සටහන් කොට පසුව ලෙජර් ගිණුම්වලට පිටපත් කර මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කරනු ලබයි.

## 1. අවසාන ඉතිරි බඩුතොගය ගැලපීම

**තොගයේ පිරිවැය (Cost of Inventory)**

තොග පිරිවැය,

(i) මිලදී ගැණුම් පිරිවැය

(ii) පරිවර්ථන පිරිවැය

(iii) වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරණ ලද පිරිවැය

යන මූලිකාංග තුනෙන් සමන්විත වේ.

**ශුද්ධ උපලබ්ධි අගය (Net Realisable Value)**

තොගයක් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකුණන ඇස්තමේන්තු කළ විකුණුම් මිලෙන් එම තොගය තව දුරටත් සම්පූර්ණ කිරීමට වැයවන ඇස්තමේන්තුගත පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළ පසු ලැබෙන අගය යි.

**තොග අගය කිරීමේ රීතිය**

.............................................................................................................................

.............................................................................................................................

| | | |
|---|---|---|
| පිරිවැය : | ඉතිරි තොග ගිණුම | හර |
| | වෙළෙඳ ගිණුම | බැර |
| | | |
| ශුද්ධ උපලබ්ධි අගය : | ලාභ හෝ අලාභ ප්‍රකාශය | හර |
| තෙක් කපා හැරීම | ඉතිරි තොග ගිණුම | බැර |

ඉතිරි බඩු තොග ගිණුමේ ශේෂය ජංගම වත්කමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතුය. වෙළෙඳ ගිණුම බැර යන්න වෙනුවට ප්‍රායෝගිකව එම ගිණුමේ හර පැත්තේ විකිණීමට ඇති භාණ්ඩවල පිරිවැය ලෙස සලකන ආරම්භක තොගයේ හා ගැණුම්වල එකතුවෙන් අඩුකිරීම අවශ්‍ය වේ. එසේ කරන්නේ ගිණුම් වර්ෂය තුළ සත්‍ය වශයෙන් විකුණූ භාණ්ඩවලින් දළ ලාභය නිවැරදිව ගණනය කර ගැනීම සඳහාය.

**(i) අවසාන ඉතිරි බඩු තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය වැඩි වන විට**

| | | |
|---|---|---|
| උදා: | ඉතිරි බඩු තොගයේ පිරිවැය | රු. 100,000 |
| | ශුද්ධ උපලබ්ධි අගය | රු. 120,000 |

ඉතිරි බඩු තොගයේ පිරිවැය ගිණුම්ගත කිරීම.

.......................................................................................................................................

.......................................................................................................................................

**ඉතිරි තොග ගිණුම**

| | |
|---|---|
| | |

**වෙළෙඳ ගිණුම**

| | | |
|---|---|---|
| විකිණුම් | | XXX |
| (-) <u>විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොගය | XXX | |
| ගැණුම් | XXX | |
| | XXX | |
| (-) අවසාන තොගය | | (XXX) |
| දළ ලාභය | | XXX |

↑ තොගයේ පිරිවැය

තොගයේ පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගයට වඩා අඩු බැවින් තොග අගය කපා හැරීමක් අවශ්‍ය නොවේ.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| ජංගම වත්කම් | | |

↑ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගය

(ii) **අවසාන ඉතිරි බඩු තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය අඩු වන විට**

උදා: ඉතිරි බඩු තොගයේ පිරිවැය රු. 100,000
ශුද්ධ උපලබ්ධි අගය රු. 80,000

ඉතිරි බඩු තොගයේ පිරිවැය ගිණුම්ගත කිරීම.

තොගයේ පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය තෙක් කපා හැරීම.

තොග අගය කපා හැරීම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් වියදමක් ලෙස හඳුනාගත යුතුය.

**ඉතිරි තොග ගිණුම**

| | |
|---|---|
| | |

**වෙළෙඳ ගිණුම**

| | | |
|---|---|---|
| විකිණුම් | | XXX |
| (-) විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | XXX | |
| ගැණුම් | XXX | |
| | XXX | |
| (-) | | (XXX) |
| දළ ලාභය | | XXX |

↑ තොගයේ පිරිවැය

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| ජංගම වත්කම් | | |

↑ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගය

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | | |
|---|---|---|
| වෙනත් වියදම් | | |

**අතිරේක කියවීම්**

# LKAS 02

## තොග ගැලපීම
## (Stock Adjustments)

### තොග (Inventories)

(i) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට තබාගෙන ඇති,

(ii) එවැනි විකිණීමක් සඳහා නිෂ්පාදනය වෙමින් පවතින,

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය තුල හෝ සේවා සැපයීමේදී පරිභෝජනය සඳහා තබාගන්නා ද්‍රව්‍ය යනාදිය යි.

මේ අනුව තොග යන්නට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා හෝ සේවා සැපයීම සඳහා හෝ විකිණීම සඳහා හෝ තබාගෙන ඇති නිමිභාණ්ඩ (Finished goods), නොනිමි භාණ්ඩ (Work-in-progress) හා අමුද්‍රව්‍ය (Raw materials) යන සංරචක අයත් වේ.

### ශුද්ධ උපලබ්ධි අගය (Net Realisable Value)

තොගයක් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකුණන ඇස්තමේන්තු කළ විකුණුම් මිලෙන් එම තොගය තව දුරටත් සම්පූර්ණ කිරීමට වැයවන ඇස්තමේන්තුගත පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩුකළ පසු ලැබෙන අගය යි.

### තොගයේ පිරිවැය (Cost of Inventory)

තොග පිරිවැය,

(i) මිලදී ගැණුම් පිරිවැය

(ii) පරිවර්ථන පිරිවැය

(iii) වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරණ ලද පිරිවැය

යන මූලිකාංග තුනෙන් සමන්විත වේ.

### මිලදී ගැණුම් පිරිවැය (Cost of Purchase)

තොගයේ ගැණුම් මිල, ආනයන තීරු බදු, ආපසු අයකරගත නොහැකි අනෙකුත් බදු, ප්‍රවාහන වියදම්, තොග එහා මෙහා කිරීමේ වියදම් සහ අනෙකුත් අදාල ඍජු වියදම් ආදියෙන් වෙළෙඳ වට්ටම්, සහනාධාර හා වෙනත් ප්‍රතිදාන අඩුකළ පසු ලැබෙන අගය මිලදී ගැණුම් පිරිවැය වේ.

## පරිවර්තන පිරිවැය (Conversion Cost)

අමුද්‍රව්‍ය නිමිභාණ්ඩ බවට පත්කිරීම සඳහා අදාල වන සෘජු ශ්‍රම පිරිවැය, වෙනත් සෘජු වියදම් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය යන ඒවායේ එකතුව පරිවර්ථන පිරිවැය නම් වේ.

## අනෙකුත් පිරිවැය (Other Cost)

මිලදී ගැණුම් පිරිවැය හා පරිවර්තන පිරිවැය යන දෙකොටසට අයත් නොවූ විශේෂිත ඇණවුමක් සඳහා මෝස්තරය නිර්මාණය කිරීමේ ගාස්තු වැනි තොග වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ පිරිවැය මීට අයත් වේ.

## පිරිවැය සූත්‍ර (Cost Formulas)

ව්‍යාපාරික තොග හඳුනාගැනීමේදී ඉතිරි තොග නියෝජනය වන්නේ කිනම් තොගයෙන්ද යන්න තීරණය කිරීමට යොදා ගන්නා ක්‍රම පිරිවැය සූත්‍ර වේ. තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කිරීමට පෙර ඉතිරි තොගය කිනම් ගැණුම්වලින් නැතහොත් කිනම් නිෂ්පාදනයෙන් නිරූපනය වන්නේද යන්න නිශ්චය කළ යුතුය.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගන්නා එක හා සමාන අයිතමයන් රාශියකින් සමන්විත තොග අගය කිරීම සඳහා පහත සඳහන් ක්‍රම යොදා ගත යුතුය.

(අ) ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ මිල ක්‍රමය
(First in First Out method - FIFO)

(ආ) හරිත (බරතැබූ) සාමාන්‍ය මිල ක්‍රමය
(Weighted Average Cost method - WAC)

## දළ ලාභ අනුපාතය

දළ ලාභ අනුපාතය යනු ව්‍යාපාරයක විකුණුම් හා දළ ලාභය අතර වූ ප්‍රතිශතක සම්බන්ධතාවය වේ. එය පහත දැක්වෙන ආකාරයට ලියා පෙන්නුම් කළ හැකිය.

$$\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

දළ ලාභ අනුපාතය යන්නෙහි සාමාන්‍ය අදහස මෙය වුවද ගිණුම්කරණයේ යම් යම් ගැටලු විසඳා ගැනීම සඳහා විකුණුම් පිරිවැයෙන් ප්‍රතිශතයක් වශයෙන්ද දළ ලාභ අනුපාතය ගණනය කළ හැකිය. විකුණුම් පිරිවැයෙන් ප්‍රතිශතයක් වශයෙන් දළ ලාභ අනුපාතය පහත දැක්වෙන පරිදි ගණනයකළ හැකිය.

$$\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම් පිරිවැය}} \times 100$$

මේ අනුව දළ ලාභ අනුපාතය දෙයාකාරයකට ඉදිරිපත් කළ හැකි බව පැහැදිලි වේ. එනම්,

(1) විකුණුම් මිලෙන් දළ ලාභ අනුපාතය

(2) විකුණුම් පිරිවැයෙන් දළ ලාභ අනුපාතය

එකම අවස්ථාවකදී ඉහත සඳහන් අනුපාත දෙක ගණනය කළහොත් ඒ එකිනෙකට ලැබෙන පිළිතුර වෙනස්ය. එහෙත් මෙම අනුපාතයන් දෙක අතර නොවෙනස්වන ඒකාකාරී සම්බන්ධතාවයක් ඇත. එනම් විකුණුම් පිරිවැයෙන් දළ ලාභ අනුපාතය සාමාන්‍ය භාගයක් ලෙස ගත්විට එහි ඉර උඩ හා ඉර යට සංඛ්‍යා දෙකේ එකතුව විකුණුම් මිලෙන් දළ ලාභ අනුපාතය පිළිබඳ සාමාන්‍ය භාගයෙහි ඉරයට සංඛ්‍යාව වීම හා අනුපාතයන් දෙකේදීම ඉර උඩ සංඛ්‍යාව නොවෙනස්ව පැවතීම වේ. මෙමගින් එක් අනුපාතයක් දන්නා විට වෙනත් තොරතුරු නොමැතිව අනෙක් අනුපාතය ගණනය කර ගැනීමට හැකියාව ලැබේ.

මෙම තත්ත්වයන් යටතේ දළ ලාභ අනුපාත චක්‍රයක් පහත සඳහන් පරිදි ගොඩනැංවිය හැකිය.

**දළ ලාභ අනුපාත චක්‍රය**

| විකුණුම් පිරිවැයෙන් දළලාභ අනුපාතය | | විකුණුම් මිලෙන් දළලාභ අනුපාතය | |
|---|---|---|---|
| 1/1 | (100%) | 1/2 | (50%) |
| 1/2 | (50%) | 1/3 | (33 1/3 %) |
| 1/3 | (33 1/3 %) | 1/4 | (25%) |
| 1/4 | (25%) | 1/5 | (20%) |
| 1/5 | (20%) | 1/6 | (16 2/3 %) |
| 2/5 | (40%) | 2/7 | (28 4/7 %) |

## අභ්‍යාසය 82

2019 මාර්තු 31 දිනට පැවති පිරිවැය රු. 3,000,000/- ක් වූ තොගයක් යල්පැන ගිය තත්ත්වයට පත්වූ අතර එම තොගය විකුණුම් මිලෙන් 20% ක විකුණුම් කොමිස් මුදලකට යටත්ව රු. 3,200,000/- ක මිලකට විකිණීමට අපේක්ෂා කරයි.

2019 මාර්තු 31 දිනට එම තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] වනුයේ,

(1) රු. 3,200,000/- (2) රු. 3,000,000/-

(3) රු. 2,560,000/- (4) රු. 640,000/-

**(AAT-AA2 - July 2019)**

## අභ්‍යාසය 83

පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 02 (LKAS - 02) තොග, අනුව තොගයක මිලදී ගැනීමේ පිරිවැය යටතේ ඇතුළත් නොවන පිරිවැයක් වන්නේ කුමක් ද?

(1) ගැනුම් මිල (2) ආනයන බදු

(3) ප්‍රවාහන ගාස්තු (4) විකුණුම් වියදම්

**(AAT-AA2 - July 2019)**

## අභ්‍යාසය 84

ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගය වැඩියෙන් සටහන් වී තිබෙන විටක, ලාභයට වන බලපෑම දක්වනු ලබන්නේ පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, කුමන ප්‍රකාශනයෙන් ද?

(1) ප්‍රවර්තන වර්ෂයේ ලාභය අඩුවෙන් සටහන් වන අතර, ඊළඟ වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වේ.

(2) ප්‍රවර්තන වර්ෂයේ ලාභය සහ ඊළඟ වර්ෂයේ ලාභය වෙනස් නොවේ.

(3) ප්‍රවර්තන වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වන අතර, ඊළඟ වර්ෂයේ ලාභය අඩුවෙන් සටහන් වේ.

(4) ප්‍රවර්තන වර්ෂයේ ලාභය වෙනස් නොවන අතර, ඊළඟ වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වේ.

**(AAT-AA2 - January 2019)**

## අභ්‍යාසය 85

සමාගමක් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය භාවිතයෙන් එහි තොග අගය කරයි. ඒකකයක් රු. 170/- බැගින් වූ පිරිවැයකට ඇගයීම් කරන ලද එක්තරා තොග අයිතමයකින් ඒකක 500 ක්, 2018 අප්‍රේල් 01 දිනට සමාගම සතුව තිබුණි.

2018 අප්‍රේල් මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

| දිනය | මිලදී ගැනුම් | විකුණුම් |
|---|---|---|
| අප්‍රේල් 05 | - | ඒකක 300 |
| අප්‍රේල් 10 | එකක් රු. 150/- බැගින් ඒකක 150 | - |
| අප්‍රේල් 27 | - | ඒකක 250 |

2018 අප්‍රේල් 30 දිනට තොගයේ අගය ගණනය කරන්න. **(AAT-AA2 - July 2018)**

## අභ්‍යාසය 86

සමන්, සමන් ට්‍රේඩර්ස් හි අයිතිකරු වේ. ව්‍යාපාරයේ සියලුම විකුණුම් ණය පදනම මත සිදු කරනු ලබයි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | |
|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට තොගය | රු. 250,000 |
| වර්ෂය සඳහා ගැනුම් | රු. 850,000 |
| 2019 මාර්තු 31 දිනට තොගය | රු. 375,000 |
| වර්ෂය සඳහා දළ ලාභය | විකුණුම්වලින් 20% |

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් ගණනය කරන්න.

**(AAT-AA2 - July 2019)**

## අභ්‍යාසය 86

රුචිර ඔහුගේ සිල්ලර ව්‍යාපාරය සඳහා යෝග්‍ය ගිණුම් වාර්තා පවත්වා නොගනී. ව්‍යාපාරයේ සියලු විකුණුම් මුදල් පදනම මත වේ. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට තොගය | රු. 670,000 |
| වර්ෂය තුලදී මිලට ගැනුම් | රු. 1,840,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය | රු. 540,000 |

ව්‍යාපාරය විකුණුම් මත 20% ක දළ ලාභයක් තබා ගන්නේ නම්, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,

(1) රු. 1,970,000/- (2) රු. 492,500/-
(3) රු. 394,000/- (4) රු. 2,364,000/-

**(AAT-AA2 - January 2018)**

## අභ්‍යාසය 86

සීමාසහිත සන් (පෞද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු අදාළ වේ.

| | |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට තොගය | රු. 450,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය | රු. 600,000 |
| වර්ෂය සඳහා ගැනුම් | රු. 900,000 |
| වර්ෂය සඳහා දළ ලාභය | විකුණුම්වලින් 40% |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්වල වටිනාකම වන්නේ,

(1) රු. 1,050,000/- (2) රු. 1,250,000/-
(3) රු. 750,000/- (4) රු. 1,470,000/-

**(AAT-AA2 - July 2017)**

### අභ්‍යාසය 87

2018 මාර්තු 31 දිනට තොග ගණනය කර අගය කරන ලද එක්තරා කේවලස්වාමි ව්‍යාපාරිකයෙකු තොගයෙන් රු. 2,000,000/- ක් පිරිවැය වූ කොටසක් යල්පැන ඇති බව හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, එම තොගය රු. 1,800,000/- ක මුදලකට විකිණිය හැකි අතර, ඒ වෙනුවෙන් විකුණුම් මිලෙන් 15% ක් වූ අමතර විකුණුම් කොමිස් මුදලක් තෙවැනි පාර්ශවයකට ගෙවිය යුතු වේ.

2018 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල දැක්විය යුතු ඉහත තොගයේ වටිනාකම හඳුනා දක්වන්න.

**(AAT-AA2 - January 2019)**

## 2. කලින් ගෙවූ වියදම් හෙවත් ඉදිරියට ගෙවූ වියදම් ගැලපීම

| | |
|---|---|
| කලින් / ඉදිරියට ගෙවූ වියදම් ගිණුම | හර |
| අදාල වියදම් ගිණුම | බැර |

කලින් ගෙවූ වියදම් ගිණුමේ ශේෂය ජංගම වත්කමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතුය. අදාළ වියදම් ගිණුම බැර යන්නෙන් අදහස් කරන්නේ එම වියදමෙන් කලින් ගෙවූ ප්‍රමාණය අඩුකළ යුතු බවයි. ලාභය හෝ අලාභය නිවැරදිව සොයාගැනීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කළ යුත්තේ වියදම්වලින් වර්ෂයට අදාල ප්‍රමාණය පමණක් බැවින් එසේ කරනු ලැබේ.

උදා: 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුල මුදලින් ගෙවූ ගෙවල් කුලී රු. 140,000 කි. මින් රු. 20,000 ක් ඉදිරි වර්ෂය සඳහා වේ.

.......................................................................................................................................

.......................................................................................................................................

**ගෙවල් කුලී වියදම් ගිණුම ⟵ වියදම් ගිණුමකි**

| | |
|---|---|
| | |
| | |

වර්ෂයට අදාල ගෙවල් කුලී වියදම් වන රු. 120,000 ලාභ හෝ අලාභ ප්‍රකාශයේ පරිපාලන වියදමක් ලෙස ඇතුලත් කරයි.

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | | |
|---|---|---|
| <u>පරිපාලන වියදම්</u> | | |
| | | |

**කලින් / ඉදිරියට ගෙවූ ගෙවල් කුලී වියදම් ගිණුම ⟵ වත්කම් ගිණුමකි**

| | |
|---|---|
| | |

කලින් / ඉදිරියට ගෙවූ ගෙවල් කුලී ගිණුමේ ශේෂය වන රු. 20,000 ජංගම වත්කමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතුය.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | |
|---|---|---|
| <u>වත්කම්</u> | | |
| <u>ජංගම නොවන වත්කම්</u> | | |
| | | |
| <u>ජංගම වත්කම්</u> | | |
| | | |

## 3. උපචිත වියදම් හෙවත් ගෙවිය යුතු වියදම්

උපචිත වියදම් යනු ගිණුම් කාලච්ඡේදය තුළ දී ව්‍යාපාරය විසින් ලබාගෙන ඇති සේවා වෙනුවෙන් ගිණුම් කාලච්ඡේදය අවසන් දින වනවිටත් නොගෙවා ඇති වියදම් ය. මේවා ගෙවිය යුතු වියදම් ලෙස ද හඳුන්වනු ලැබේ. මෙම උපචිත වියදම් වටිනාකම ව්‍යාපාරයේ වගකීමකි.

| | |
|---|---|
| අදාල වියදම් ගිණුම | හර |
| උපචිත / ගෙවිය යුතු වියදම් ගිණුම | බැර |

අදාල වියදම් ගිණුම හර යන්නෙහි අදහස එම වියදමට ගෙවිය යුතු ප්‍රමාණය එකතු කළ යුතු බවයි. එසේ කළ යුතු වන්නේ ලාභය හෝ අලාභය නිවැරදිව සොයා ගැනීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වන්නේ වියදම්වලින් වර්ෂයට අදාළ ප්‍රමාණය වන බැවිනි. උපචිත වියදම් ගිණුමේ ශේෂය ජංගම වගකීමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතු ය.

උදා: 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ දුරකථන බිල්පත්හි වටිනාකම රු. 60,000 කි. 2017 මාර්තු මස දුරකථන බිල රු. 7,000 ක් වන අතර එය තවම මුදලින් ගෙවා නැත.

..........................................................................................................................................

..........................................................................................................................................

**දුරකථන වියදම් ගිණුම ⟵ වියදම් ගිණුමකි**

| | |
|---|---|
| | |

වර්ෂයට අදාළ දුරකථන වියදම රු. 67,000 ලාභ හෝ අලාභ ප්‍රකාශයේ පරිපාලන වියදමක් ලෙස ඇතුලත් කරයි.

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | | |
|---|---|---|
| <u>පරිපාලන වියදම්</u> | | |

**උපචිත / ගෙවිය යුතු දුරකථන වියදම් ගිණුම ⟵ වගකීම් ගිණුමකි**

| | |
|---|---|
| | |

උපචිත / ගෙවිය යුතු දුරකථන වියදම් ගිණුමේ ශේෂය වන රු. 7,000 ජංගම වගකීමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු ය.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | |
|---|---|---|
| <u>ජංගම වගකීම්</u> | | |

# 4. කලින් ලැබූ ආදායම් හෙවත් ඉදිරියට ලැබූ ආදායම් ගැලපීම

| | |
|---|---|
| අදාල ආදායම් ගිණුම | හර |
| කලින් / ඉදිරියට ලද ආදායම් ගිණුම | බැර |

අදාල ආදායම් ගිණුම හර යන්නෙහි අදහස එම ආදායමින් කලින් ලැබූ ප්‍රමාණය අඩුකළ යුතු බවයි. එසේ කළ යුතු වන්නේ ලාභය හෝ අලාභය නිවැරදිව සොයා ගැනීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කළ යුත්තේ ආදායම්වලින් වර්ෂයට අදාල ප්‍රමාණය පමණක් වන බැවිනි. කලින් ලැබූ ආදායම් ගිණුමේ ශේෂය ජංගම වගකීමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතු ය.

උදාඃ 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුල මුදලින් ලැබූ කඩ කුලිය රු. 70,000 කි. මාසික කඩ කුලිය රු. 5,000 ක් වන අතර මාස 02 ක කඩ කුලිය ඉදිරි වර්ෂය සඳහා වේ.

..........................................................................................................................................

..........................................................................................................................................

**කඩ කුලී ආදායම් ගිණුම ⟵ ආදායම් ගිණුමකි**

| | | | |
|---|---|---|---|
| | | | |

වර්ෂයට අදාළ කඩ කුලී ආදායම වන රු. 60,000 ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දළ ලාභයට යටින් වෙනත් ආදායමක් ලෙස ඇතුලත් කරයි.

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | | |
|---|---|---|
| දළ ලාභය | | xxx |
| <u>වෙනත් ආදායම්</u> | | |

**කලින් / ඉදිරියට ලද කඩ කුලී ආදායම් ගිණුම ⟵ වගකීම් ගිණුමකි**

| | | | |
|---|---|---|---|
| | | | |

කලින් / ඉදිරියට ලද කඩ කුලී ආදායම් ගිණුමේ ශේෂය වන රු. 10,000 ජංගම වගකීමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු ය.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| ජංගම වගකීම් | | |
|---|---|---|
| | | |

## 5. උපචිත ආදායම් හෙවත් ලැබිය යුතු ආදායම් ගැලපීම

ලැබිය යුතු ආදායම් යනු ගිණුම් කාලච්ඡේදයට අදාළව ලැබිය යුතු නමුත් ගිණුම් කාලපරිච්ඡේදය අවසාන වනවිටත් ව්‍යාපාරයට ලැබී නැති ආදායම් වේ. මේවා උපචිත ආදායම් ලෙස ද හඳුන්වයි. ලැබිය යුතු ප්‍රමාණය ව්‍යාපාරයේ වත්කමක් වේ.

| | |
|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම | හර |
| අදාල ආදායම් ගිණුම | බැර |

ලැබිය යුතු ආදායම් ගිණුමේ ශේෂය ජංගම වත්කමක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතුය. අදාල ආදායම් ගිණුම බැර යන්නෙහි අදහස එම ආදායමට ලැබිය යුතු ආදායම් ප්‍රමාණය එකතු කළ යුතු බවයි. එසේ කළ යුතු වන්නේ ලාභය හෝ අලාභය නිවැරදිව සොයා ගැනීම සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කළ යුත්තේ ආදායම්වලින් වර්ෂයට අදාල ප්‍රමාණය වන බැවිනි.

උදා: 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුල මුදලින් ලැබූ පොලී ආදායම 30,000 කි. එය පළමු කාර්තු තුන සඳහා අදාල වේ. අවසාන කාර්තුවේ පොලී ආදායම වන රු. 10,000 ලැබිය යුතුව ඇත.

..........................................................................................................................................

..........................................................................................................................................

**ලැබිය යුතු පොලී ආදායම් ගිණුම ⟵ වත්කම් ගිණුමකි**

| | | | |
|---|---|---|---|
| | | | |

ලැබිය යුතු පොලී ආදායම් ගිණුමේ ශේෂය වන රු. 10,000 ජංගම වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු ය.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| ජංගම වත්කම් | | |
|---|---|---|
| | | |

**පොලී ආදායම් ගිණුම ⟵ ආදායම් ගිණුමකි**

| | | | |
|---|---|---|---|
| | | | |

වර්ෂයට අදාල පොලී ආදායම වන රු. 40,000 ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දල ලාභයට යටින් වෙනත් ආදායමක් ලෙස ඇතුලත් කරයි.

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | | |
|---|---|---|
| දල ලාභය | | |
| වෙනත් ආදායම් | | |

### අභ්‍යාසය 88

සීමාසහිත එවර් රීච් (පෞද්ගලික) සමාගමට දේපළ කිහිපයකින් කුලී ආදායම් ලැබේ. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී සමාගම ලද මුළු කුලිය රු. 481,200/- කි.

| විස්තරය | 2017 අප්‍රේල් 01 දිනට (රු.) | 2018 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| කලින් ලද කුලී | 28,700 | 31,200 |
| හිඟ කුලී | 21,200 | 18,400 |

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු කුලී ආදායම වන්නේ,

(1) රු. 475,900 (2) රු. 460,900/- (3) රු. 486,500/- (4) රු. 501,500/-

**(AAT-AA2 - January 2019)**

## 6. ව්‍යාපාරිකයාගේ භාණ්ඩ ගැනිලි ගැලපීම

| | |
|---|---|
| ගැනිලි ගිණුම | හර |
| ගැණුම් ගිණුම හෝ වෙළෙඳ ගිණුම | බැර |

ගැනිලි ගිණුම හර යන්නෙහි අදහස දැනට එම ගිණුමේ ශේෂයක් ඇත්නම් එයට එකතුවන බවයි. ගැනිලි ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරයට අයවිය යුතු වටිනාකමක් හෙවත් හිමිකම් අඩුවීමක් වන අතර ගැනිලි ගිණුමේ අවසාන ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී අයිතිකරුගේ ප්‍රාග්ධනයෙන් අඩුකිරීමක් ලෙස පෙන්විය යුතුය. වෙළෙඳ ගිණුම බැර යන්නෙහි අදහස එම

ගිණුමේ හර පැත්තේ විකිණීමට ඇති භාණ්ඩ ලෙස සලකන ආරම්භක තොගය හා ගැණුම් පිරිවැයෙහි එකතුවෙන් අඩුකළ යුතු බවයි. එසේ කළ යුතු වන්නේ භාණ්ඩ ගැනිලි හේතු කොට ගෙන ව්‍යාපාරයෙහි විකිණීමට ඇති භාණ්ඩ ප්‍රමාණය අඩුවන බැවිනි.

උදා: 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ අයිතිකරු විසින් රු. 30,000 ක් පිරිවැය වූ වෙළෙඳ භාණ්ඩ තොග තම පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත. මේ පිළිබඳ කිසිම සටහනක් ගිණුම් පොත්වල දක්වා නොමැත.

**වෙළෙඳ ගිණුම**

| | | |
|---|---|---|
| විකිණුම් | | XXX |
| (-) <u>විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොගය | XXX | |
| ගැණුම් | XXX | |
| | XXX | |
| (-) | | |
| | XXX | |
| (-) අවසාන තොගය | (XXX) | (XXX) |
| දළ ලාභය | | XXX |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | |
|---|---|---|
| 2016/04/01 දිනට ප්‍රාග්ධන ශේෂය | | XXX |
| (+) වර්ෂයේ ලාභය | | XXX |
| | | XXX |
| (-) ගැනිලි (මුදල් + භාණ්ඩ) | | (30,000) |
| 2017/03/31 දිනට ප්‍රාග්ධන ශේෂය | | XXX |

## 7. බොල්ණය (Bad Debts)

ව්‍යාපාරයක් විසින් වෙළෙඳ භාණ්ඩ ණයට විකුණූ විට ලැබිය යුතු ණය ප්‍රමාණය වෙළෙඳ ණයගැතියෝ නමින් වත්කමක් බවට පත් වේ. ඇතැම් ණයගැතියන් මිය යාම, බුංවත් වීම යන කරුණු මත ව්‍යාපාරයකට ලැබීමට ඇති ණය නොලැබී යා හැකි ය.

කුමන හේතුවක් මත හෝ ණයගැතියෙකුගෙන් අයවිය යුතු මුදලක් නිශ්චිතව ම අයකර ගත නොහැකි තත්වයට පත් වුවහොත් එසේ නොලැබේ යැයි තීරණය කරන ණය බොල් ණය ලෙස හැඳින්විය හැකි ය.

**(i) බොල්ණය කපාහැරීම**

..............................................................................................................................................

..............................................................................................................................................

**(ii) අඩමාන ණය ලෙස වෙන්කර ඇති ණය මුදලක් බොල්ණය ලෙස කපාහැරීම**

..............................................................................................................................................

..............................................................................................................................................

**(iii) කපාහරින ලද බොල්ණය ආපසු ලැබීම**

**අ) ණයගැතියා නගා සිටුවීම**

| | |
|---|---|
| ණයගැතියාගේ ගිණුම | හර |
| බොල්ණය ගිණුම / ලාභ හෝ අලාභ ප්‍රකාශය | බැර |

ප්‍රවර්ථන වර්ෂය තුල කපාහරින ලද ණය මුදලක් ආපසු ලැබේ නම් බොල්ණය ගිණුමට ද පෙර වර්ෂයක කපාහරින ලද ණය මුදලක් ආපසු ලැබේ නම් ලාභ හෝ අලාභ ප්‍රකාශයට ද බැර කෙරේ.

**ආ) මුදල් ලැබීම**

| | |
|---|---|
| මුදල් ගිණුම | හර |
| ණයගැතියාගේ ගිණුම | බැර |

කපා හරින ලද බොල් ණය ආපසු ලැබීම

| මෙම වර්ෂයේ කපා හරින ලද බොල් ණය ආපසු ලැබීම | පෙර වර්ෂයේ කපා හරින ලද බොල් ණය ආපසු ලැබීම |
| --- | --- |
| අ) ණයගැතියා නගා සිටුවීම | අ) ණයගැතියා නගා සිටුවීම |
| .......................................................... | .......................................................... |
| .......................................................... | .......................................................... |
| ආ) මුදල් ලැබීම | ආ) මුදල් ලැබීම |
| .......................................................... | .......................................................... |
| .......................................................... | .......................................................... |

සටහන්

1. බොල්ණය ගිණුමේ ශේෂය වර්ෂය අවසානයේදී ආදායම් ප්‍රකාශය මාරු කෙරේ.
2. බොල්ණය සඳහා වෙනම ම ගිණුමක් පවත්වා නොගෙන අඩමාන ණය සඳහා වෙන්කිරීමේ ගිණුම තුළින් ම බොල්ණය කපාහැරීමේ විකල්ප ක්‍රමයක් භාවිතයේ පවතී. එම ක්‍රමය අනුගමනය කරන්නේ නම් ඉහත ද්විත්ව සටහන්වල තිබෙන බොල්ණය ගිණුමට හර හෝ බැර කෙරෙන වටිනාකම් අඩමාන ණය සඳහා වෙන්කිරීමේ ගිණුමට හර හෝ බැර කළ යුතු ය.

## 8. අඩමාන ණය සඳහා වෙන්කිරීම (Provision for Doubtful Debts)

කිසියම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයක දී ව්‍යාපාරයට අයවිය යුතුව තිබෙන ණයවලින් අය කර ගත නොහැකි  යැයි ඇස්තමේන්තු කරනු ලබන එහෙත් නිශ්චිතවම නොදන්නා ප්‍රමාණයක් වෙනුවෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙන් වෙන්කරනු ලබන වටිනාකම අඩමාන ණය සඳහා වෙන්කිරීම නම් වේ. අඩමාන ණය සඳහා වෙන්කරනු ලබන ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට යොදා ගන්නා ක්‍රම කිහිපයකි.

# ද්විත්ව සටහන් :

**(i) අඩමාන ණය සඳහා අලුතින්ම වෙන්කිරීමක් ඇති කිරීම.**

.......................................................................................................................................................

.......................................................................................................................................................

**(ii) අඩමාන ණය සඳහා ඌන වෙන්කිරීම.**

.......................................................................................................................................................

.......................................................................................................................................................

**(iii) අඩමාන ණය සඳහා අධි වෙන්කිරීම.**

.......................................................................................................................................................

.......................................................................................................................................................

අඩමාන ණය ගිණුමේ ශේෂය වර්ෂය අවසානයේදී ලාභ හෝ අලාභ ප්‍රකාශයට මාරු කෙරේ. අඩමාන ණය සඳහා වෙන්කිරීමේ ගිණුම ණයගැතියන්ට එරෙහිව ඇති කළ ප්‍රතිපාදනයක් බැවින් එහි ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ණයගැතියන්ගෙන් අඩු කිරීමක් ලෙස පෙන්නුම් කරනු ලැබේ.

සටහන :

අඩමාන ණය ගණනය කළ යුත්තේ බොල්ණය කපාහැරීමෙන් පසු ඉතිරිවන ණයගැති ශේෂය පදනම් කරගෙනය.

උදා: 2017/03/31 දිනට ව්‍යාපාරයේ ණයගැති ශේෂය රු. 430,000 ක් වන අතර 2016/04/01 දිනට අඩමාන ණය වෙන් කිරීමේ ශේෂය රු. 25,000 කි. 2017/03/31 දිනට අයවිය යුතු ණයගැති ශේෂයෙන් රු. 30,000 ක් බොල්ණය ලෙස කපා හැරීමට තීරණය කළ අතර ඉතිරි ණයගැතියන්ගෙන් 10% වන සේ අඩමාන ණය ගැලපීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

**ණයගැති පාලන ගිණුම ⟵ වත්කම් ගිණුමකි**

| | |
|---|---|
| | |

**බොල්ණය ගිණුම ⟵ වියදම් (අලාභ) ගිණුමකි**

**අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම**

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

**2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

## අභ්‍යාසය 89

01. සීමාසහිත AB සමාගමේ 2010 මාර්තු 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය රු. 136,000/- ක් සහ 2009 අප්‍රේල් 01 දිනට අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනය රු. 2,720/- ක් විය. පීටර් නමැති එක් ණයගැතියෙක් 2010 මාර්තු මාසයේ දී බුන්වත්භාවයට පත්වී ඇති බව ප්‍රකාශයට පත්වූ අතර ඔහුගෙන් ලැබිය යුතුව ඇත රු. 17,000/- ක මුදල ලියා හැරීමට තීරණය කරන ලදී. ඉහත සඳහන් ලියාහැරීම වාර්තාගත කිරීම සඳහා ගිණුම් පොත්වල සටහන් කිසිවක් තබා නැත. ඉහත සඳහන් දේවලට අමතරව බොල් ණය ලෙස 2009 අප්‍රේල් 01 දිනට පෙර ලියා හරින ලද රු. 25,000/- ක මුදලක් 2010 ජනවාරියේ දී අයකර ගන්නා ලදී. හිඟ හිටි ණයගැති ශේෂයෙන් 2% බැගින් අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සැලසීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

ඒ අනුව, 2010 මාර්තු 31 දිනට අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය වන්නේ:

(1) රු. 2,720/- කි.
(2) රු. 2,380/- කි.
(3) රු. 1,880/- කි.
(4) ඉහත සඳහන් කිසිවක් නොවේ.

**(AAT - December 2010)**

02. සමාගමක ණයගැතියෙකු (ලැබිය යුතු ගිණුම) බුන්වත්භාවයට පත්වූ බැව් ප්‍රකාශයට පත් කෙරිණි. සමාගම මෙම ණය සඳහා දැනටමත් නිශ්චිත අඩමාන ණය ප්‍රතිපාදනයක් සලසා ඇත. මෙය සටහන් කිරීමට දැන් අවශ්‍ය ද්විත්ව සටහන වනුයේ,

| | හර | බැර |
|---|---|---|
| (1) | අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ගිණුම | බොල් ණය ගිණුම |
| (2) | ලාභාලාභ ගිණුම | බොල් ණය ගිණුම |
| (3) | අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ගිණුම | ණයගැතියාගේ ගිණුම |
| (4) | ලාභාලාභ ගිණුම | ණයගැතියාගේ ගිණුම |

**(AAT - December 2008)**

## 9. ජංගම නොවන වත්කම්වල ක්ෂයවීම ගැලපීම

| | |
|---|---|
| ක්ෂය ගිණුම | හර |
| ක්ෂය සඳහා වෙන්කිරීමේ ගිණුම | බැර |

ක්ෂය ගිණුමේ ශේෂය වියදමක් ලෙස සලකා ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් කළ යුතුය. ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැර යන්නෙහි අදහස එම ගිණුමේ දැනටමත් ඇති බැර ශේෂයට එකතු කළ යුතු බවයි. ක්ෂය වෙන්කිරීම අදාල ජංගම නොවන වත්කමේ පිරිවැයෙන් අඩුකිරීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්නුම් කළ යුතු ය.

# ජංගම නොවන වත්කම් හා ක්ෂයවීම්

**ක්ෂයවීම (Depreciation)**

වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල ව විභජනය කිරීම වේ.

**ක්ෂය කළ හැකි අගය (Depreciable Value)**

වත්කමක අවශේෂ වටිනාකම අඩු කළ පිරිවැය හෝ පිරිවැය වෙනුවට ආදේශ කර ඇති වෙනත් අගයක් වේ.

.........................................................................................................................................................

**අවශේෂ වටිනාකම / සුන්බුන් වටිනාකම (Residual Value)**

ඵලදායී ජීවිත කාලය අවසානයේ දී අපේක්ෂිත තත්ත්වයට අදාල වත්කම පත්ව ඇත්නම්, වර්තමානයේ දී වත්කම බැහැර කිරීමෙන් ලබා ගතහැකි අගයෙන් අපේක්ෂිත බැහැර කිරීමේ පිරිවැය අඩු කළ පසුව ලැබෙන අගය යි.

**ධාරණ අගය / ලියාහල අගය (Carrying Amount)**

වත්කමක සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු එය හඳුනාගන්නා අගය වේ.

.........................................................................................................................................................

**සරල මාර්ග ක්ෂය ක්‍රමය (Straight Line Method)**

වත්කමක ක්ෂය වන අගය එහි ඵලදායී ජීව කාලය පුරා සමානුපාතිකව විභාජනය කිරීම සරල මාර්ග ක්ෂය ක්‍රමය නම් වේ. සරල මාර්ග ක්ෂය ක්‍රමය පහසුවෙන් ගණනය කළ හැකි ක්‍රමයක් වන අතර මෙම ක්‍රමය අනුව සෑම වර්ෂයකදී ම වත්කමක් වෙනුවෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයට ක්ෂය වශයෙන් එක හා සමාන වටිනාකමක් හර කෙරෙන නිසා වර්ෂයෙන් වර්ෂය ලාභය විචලනය නොවේ.

කල්බදු දේපල වැනි ක්‍රමක්ෂය වන වත්කම් සඳහා මෙම ක්‍රමය ඉතා සුදුසුය. මෙම ක්‍රමය යටතේ වාර්ෂික ක්ෂයවීම පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

1. වත්කමේ පිරිවැය හා වාර්ෂික ක්ෂය ප්‍රතිශතය දී ඇත්නම් එම පිරිවැයෙන් අදාල ප්‍රතිශතය ගැනීම.

.........................................................................................................................................................

2. වත්කමේ පිරිවැය හා ඵලදායී ජීවිත කාලය පමණක් දී ඇත්නම් එම පිරිවැය ඵලදායී ජීවිත කාලයෙන් බෙදීම.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

3. වත්කමේ පිරිවැය, සුන්බුන් අගය හා ඵලදායී ජීවිත කාලය දී ඇත්නම් පිරිවැයෙන් සුන්බුන් අගය අඩුකොට ඵලදායී ජීවිත කාලයෙන් බෙදීම.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

### හීන වන ශේෂ ක්‍රමය

මෙම ක්‍රමය භාවිතා කළ හැකි වනුයේ වත්කමෙන් ව්‍යාපාරයට ලැබෙන්නාවූ ආර්ථික ප්‍රතිලාභ වත්කමේ සක්‍රීය ජීවිත කාලය පුරා ක්‍රමයෙන් හීනවී යන ස්වරූපයක් උසුලන වත්කම් සම්බන්ධයෙනි. වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබනුයේ වත්කමේ පොත් අගය පදනම් කරගෙනය. මේ අනුව ජීවිත කාලය ආරම්භයේදී වාර්ෂික ක්ෂය ප්‍රමාණය සාපේක්ෂව වැඩි අගයක් වන අතර, ජීවිත කාලය අවසානයේ ක්ෂය ප්‍රමාණය සාපේක්ෂව අඩු අගයක් ගනී.

## ක්ෂය සම්බන්ධ ගිණුම් තැබීම :

**ක්ෂය වෙන්කිරීමේ ක්‍රමය :**

මෙම ක්‍රමයේදී වත්කමට අදාල වාර්ෂික ක්ෂය ප්‍රමාණය වෙනමම ගිණුමකට රැස් කරනු ලබයි. මේ නිසා වත්කම් ගිණුම එහි පිරිවැයට පවත්වාගනු ලබයි. වාර්ෂික ක්ෂයවීම සටහන් කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

| | | |
|---|---|---|
| ක්ෂය ගිණුම | හර | |
| ක්ෂය සඳහා වෙන්කිරීමේ ගිණුම | | බැර |

ක්ෂය ගිණුම වියදමක් නිසා එහි ශේෂය වර්ෂය අවසානයේදී නිෂ්පාදන ගිණුමට / ලාභ හෝ අලාභ ප්‍රකාශයට මාරු කෙරේ. ක්ෂය වෙන්කිරීමේ ගිණුම වගකීමක් වන නමුත් එහි ශේෂය මූලය තත්ත්ව ප්‍රකාශය තුළ අදාළ වත්කමේ පිරිවැයෙන් අඩුකිරීමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

**ස්ථාවර වත්කම් ඉවත් කිරීම :**

ව්‍යාපාරයක භාවිතා කරන වත්කමක් එහි ජීව කාලය තුළදී හෝ ජීව කාලය අවසානයේදී හෝ විකිණීමට, වෙනත් වත්කමක් සමඟ හුවමාරු කිරීමට එසේත් නැතහොත් යම් හේතුවක් මත ඉවත් කිරීමට සිදුවිය හැකිය. එසේ ස්ථාවර වත්කමක් ඉවත් කිරීමට හේතු වන්නේ එම වත්කම යල්පැනීම, අඩපන වීම හෝ අතිරික්ත වීම වැනි හේතූන්ය. එවැනි අවස්ථාවකදී වත්කම ඉවත් කිරීමෙන් ඇතිවන ශුද්ධ ලාභය හෝ අලාභය හෝ හෙලිදරව් වන පරිදි අදාල ගණුදෙනු ගිණුම්ගත කිරීම වැදගත් වේ. එහිදී වත්කම ඉවත් කිරීමේ ශුද්ධ ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා වත්කම් ඉවත් කිරීමේ ගිණුම නමින් ගිණුමක් විවෘත කෙරේ.

**ක්ෂය වෙන්කිරීමේ ක්‍රමය යටතේ වත්කම් ඉවත් කිරීමේ සටහන් :**

(1) වත්කමේ පිරිවැය :

.......................................................................................................

.......................................................................................................

(2) වත්කමේ සමුච්චිත ක්ෂය : (ගත් දිනයේ සිට ඉවත් කරන දිනය දක්වා වූ ක්ෂය)

.......................................................................................................

.......................................................................................................

(3) වත්කමේ විකුණුම් මිල :

.......................................................................................................

.......................................................................................................

(4) වත්කම් ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය :

(අ) ලාභයක් නම්:

| | |
|---|---|
| වත්කම් ඉවත් කිරීමේ ගිණුම | හර |
| ලාභ හෝ අලාභ ප්‍රකාශය | බැර |

(ආ) අලාභයක් නම්:

| | |
|---|---|
| ලාභ හෝ අලාභ ප්‍රකාශය | හර |
| වත්කම් ඉවත් කිරීමේ ගිණුම | බැර |

(5) ඉවත් කරන ලද වත්කම භාවිතා කළ කාලච්ඡේදය සඳහා ක්ෂය කිරීම.

## අභ්‍යාසය 90

01. සීමාසහිත අනුරාධා (පෞද්ගලික) සමාගම, 2016 අප්‍රේල් 01 දින රු. 1,000,000/- ක පිරිවැයකට යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය. යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ආයු කාලය වර්ෂ 5 ක් වන අතර, ඇස්තමේන්තුගත සුන්බුන් අගය රු. 100,000/-

2017 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය වන්නේ,

(1) රු. 720,000/- (2) රු. 726,000/-
(3) රු. 738,800/- (4) රු. 740,360/-

**(AAT-AA2 - January 2018)**

02. 2017 අප්‍රේල් 01 දිනට සීමාසහිත ඊ සමාගමේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| මෝටර් වාහනය - පිරිවැයට (2014 අප්‍රේල් 01 දින මිලදීගත්) | 5,000 | |
| සමුච්චිත ක්ෂය - මෝටර් වාහනය | | 1,500 |

මෝටර් වාහනයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 10 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත. 2018 මාර්තු 31 දින සමාගම, මෙම මෝටර් වාහනය රු. 3,200,000/- කට, විකුණන ලදී.

ඉහත සඳහන් තොරතුරුවලට අනුව, මෝටර් වාහනය ඉවත්කිරීමේ ලාභය හෝ අලාභය වන්නේ,

(1) රු. 200,000/- ක ලාභයකි. (2) රු. 200,000/- ක අලාභයකි.
(3) රු. 300,000/- ක ලාභයකි. (4) රු. 300,000/- ක අලාභයකි.

**(AAT-AA2 - July 2018)**

03. **සීමාසහිත හාඩි (පෞද්ගලික) සමාගම**, විසින් 2014 අප්‍රේල් 01 දින රු. 500,000/- ක පිරිවැයකට පිරියතයක් අත්පත් කරගන්නා ලදී. පිරියතෙහි අපේක්ෂිත ආයු කාලය අවුරුදු පහක් වන අතර සරල මාර්ග ක්‍රමයට වත්කම ක්ෂය කරනු ලබයි. ආයුකාලය අවසානයේ එහි සුන්බුන් වටිනාකම පිරිවැයෙන් 10% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අය කළ යුතු ක්ෂය ප්‍රමාණය වන්නේ,

(1) රු. 150,000/- කි. (2) රු. 180,000/- කි.
(3) රු. 100,000/- කි. (4) රු. 90,000/- කි.

**(AAT-AA2 - January 2017)**

04. සීමාසහිත ABC සහ සමාගම 2012 ජනවාරි 01 දින රු. 600,000/- කට වාහනයක් විකුණන ලදී. වාහනයේ පිරිවැය රු. 900,000/- වූ අතර, 2011 අප්‍රේල් 01 දින සමුච්චිත ක්‍ෂය රු. 450,000/- ක් විය. සමාගම විසින් මෙම වත්කම සඳහා වර්ෂයකට 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්‍ෂය කරන ලදී.

ඉහත තොරතුරුවලට අනුව, වාහනය ඉවත් කිරීමේ ලාභය වන්නේ,

(1) රු. 330,000/- කි (2) රු. 195,000/- කි
(3) රු. 150,000/- කි (4) රු. 285,000/- කි **(AAT - July 2012)**

05. එක්තරා දිනකදී උපුටාගනු ලැබූ ශේෂ පත්‍රයක පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කරයි.

| | රු. |
|---|---|
| පිරියත | 120,000 |
| සමුච්චිත ක්‍ෂය | 30,000 |

පිරියත වර්ෂයකට 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්‍ෂය කරනු ලැබේ. පිරියතේ සුන්බුන් අගය රු. 20,000/- ක් වන්නේ නම්, එම පිරියත මිලට ගනු ලැබ ඇත්තේ:

(1) වර්ෂ 7 කට පෙර ය (2) වර්ෂ 3 කට පෙර ය
(3) වර්ෂ 4 කට පෙර ය (4) වර්ෂ 10 කට පෙර ය

**(AAT - June 2010)**

06. සමාගමක් 2010 අප්‍රේල් 01 දින රු. 800,000/- කට යන්ත්‍රයක් අත්පත් කරගෙන, වර්ෂයකට 20% බැගින් හීනවන ශේෂය ක්‍රමය යටතේ ක්ෂය කරයි. 2012 මාර්තු 31 දිනට මෙම යන්ත්‍රයේ ධාරණ අගය (ශුද්ධ පොත් අගය) වන්නේ:

(1) රු. 640,000/- (2) රු. 480,000/-
(3) රු. 512,000/- (4) රු. 410,000/- **(AAT - January 2013)**

07. ගෝල්ඩන් සමාගම ක්ෂය කළ හැකි වත්කමක් විකිණීමෙන් පාඩුවක් ලැබීය. මෙම වත්කම විකිණීමෙන් ලැබුන මුදල:

(1) වත්කමේ පිරිවැයට වඩා වැඩි ය
(2) වත්කමේ පිරිවැයට වඩා අඩු වුවද ලියාහල අගයට වඩා වැඩි ය
(3) වත්කමේ ලියාහල අගයට වඩා අඩු ය
(4) වත්කමේ ලියාහල අගයට සමාන ය **(AAT - December 2010)**

08. පොත් අගය රු. 550,000/- ක් ලෙස තිබූ මෝටර් වාහනයක් සමාගමක් විසින්, එක් අවුරුද්දක දී රු. 700,000/- කට පෙරේරාට ණයට විකුණන ලදී. එම මෝටර් වාහනයේ මුල් පිරිවැය රු. 1,300,000/- ක් වූයේ නම්, ගනුදෙනුවට අදාලව පහත සඳහන් කුමන ප්‍රකාශය සාවද්‍යදැයි (incorrect) තෝරන්න.

(1) විකුණන ලද මෝටර් වාහනයේ සමුච්චිත ක්ෂය රු. 600,000/- කි.
(2) පෙරේරාගෙන් රු. 700,000/- ක් ලැබිය යුතුව තිබුණි.
(3) මෝටර් වාහනයේ පිරිවැය වන රු. 1,300,000/- සහ, එහි සමුච්චිත ක්ෂය, මෝටර් වාහන ඉවත් කිරීමේ ගිණුමට මාරු කළ යුතුය.
(4) මෝටර් වාහනය විකුණා ඉවත් කිරීමේ ලාභය රු. 150,000/- කි.

**(AAT - December 2009)**

09. ගනුදෙනුවක බලපෑම පහත සඳහන් පරිදි හඳුනාගනු ලැබේ:

| | ප්‍රාග්ධනය | වගකීම් | වත්කම් |
|---|---|---|---|
| (රුපියල්) | -50,000/- | නැත | -350,000/- +300,000/- |

ඉහත හඳුනාගත් බලපෑම, ඇතිවන්නේ පහත දැක්වෙන කවර ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙසද?

(1) රු. 350,000/- ක් ණයහිමියන්ට (ගෙවිය යුතු ගිණුම්) ගෙවා දැමීම.
(2) ශුද්ධ පොත් අගය (net book value) රු. 350,000/- ක් වූ වාහනයක් රු. 300,000/- කට විකිණීම.
(3) ප්‍රවාහනය කිරීම සඳහා රු. 50,000/- ක ගෙවීමක් සහිතව පිරියතක් මිල දී ගැනීම සඳහා රු. 300,000/- ක් ගෙවීම.
(4) ඉහත (2) සහ (3) යන දෙකම වේ. **(AAT - June 2009)**

10. සමාගමක් විසින් 2007 අප්‍රේල් 01 දින පිරියතක් මිලදී ගන්නා ලද අතර, එය හීනවන ශේෂ ක්‍රමය (reducing balance method) යටතේ වර්ෂයකට 20% බැගින් ක්ෂය කරන ලදී. 2009 මාර්තු 31 දිනට පිරියතේ ශුද්ධ පොත් අගය රු. 640,000/- ක් විණි නම්, පිරියතේ මුල් පිරිවැය (original cost) වූයේ:

(1) රු. 1,250,000/- කි. (2) රු. 800,000/- කි.
(3) රු. 1,000,000/- කි. (4) රු. 1,066,667/- කි. **(AAT - June 2009)**

11. සීමාසහිත දෙව්මි (පෞද්ගලික) සමාගම, 2017 අප්‍රේල් 01 දින රු. 2,000,000/- ක පිරිවැයකට යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදී. එහි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් වූ අතර, 5 වන වර්ෂය අවසානයේ සුන්බුන් අගය රු. 200,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. යන්ත්‍රය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලබයි.

2019 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය වන්නේ,

(1) රු. 1,600,000/- කි. (2) රු. 1,080,000/- කි.
(3) රු. 1,440,000/- කි. (4) රු. 1,280,000/- කි. **(AAT - July 2019)**

12. සමාගමක් විසින් එක්තරා වර්ෂයක් තුල පොත් අගය රු. 275,000/- ක් වූ වාහනයක් රු. 350,000/- ක මුදලකට පෙරේරා ට ණයට විකුණන ලදී. එම වාහනයේ මුල් වටිනාකම (original cost) රු. 650,000/- ක් වූයේ නම්, පහත සඳහන් දෑ ඒවායින් වැරදි ප්‍රකාශය කුමක් ද?
    (1) වාහනයේ සමුච්චිත ක්ෂය වෙන් කිරීම රු. 375,000/- කි.
    (2) පෙරේරා ට රු. 350,000/- ක මුදලක් ගෙවීමට ඇත.
    (3) වාහනයේ පිරිවැය වූ රු. 650,000/- සහ සමුච්චිත ක්ෂය වෙන්කිරීම වාහන ඉවත් කිරීමේ ගිණුමට මාරු කිරීම කළ යුතු ය.
    (4) මෝටර් වාහනය විකිණීමේ ලාභය රු. 75,000/- කි. **(AAT - June 2008)**

13. සමාගමක් විසින් 2008 ජනවාරි 1 වන දින රු. 1,050,000/- කට යන්ත්‍රෝපකරණ මිලට ගන්නා ලදී. එම යන්ත්‍රෝපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය වූ වසර 5 අවසානයේ සුන් බුන් අගය රු. 30,000/- කි. 2008.03.31 දිනට යන්ත්‍රෝපකරණවල ලියා අඩුකළ අගය (written down value) වන්නේ:
    (1) රු. 1,050,000/-    (2) රු. 932,500/-
    (3) රු. 1,010,400/-    (4) රු. 999,000/- **(AAT - June 2008)**

## අභ්‍යාසය 91

ශ්‍රී හරාන් එන්ටර්ප්‍රයිස් හි මෝටර් වාහන පිළිබඳ විස්තර පහත දැක්වේ.

(1) 2014 ජූලි 01 දින රු. 3,200,000/- ක පිරිවැයකට මිලට ගත් බෙදාහැරීමේ වෑන් රථය 2016 ජූලි 01 දින රු. 2,000,000/- කට විකුණන ලදී.

(2) 2016 ඔක්තෝම්බර් 01 දින රු. 4,500,000/- ක පිරිවැයකට නව බෙදාහැරීමේ ට්‍රක් රථයක් මිලට ගන්නා ලදී.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, මෝටර් වාහන, පිරිවැය මත 25% බැගින්, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමයි.

(4) ව්‍යාපාරයේ වෙනත් මෝටර් වාහන නොමැති බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) මෝටර් වාහන විකිණීම මත ලාභය (අලාභය) (ලකුණු 03)
(b) මෝටර් වාහන මත වර්ෂය සඳහා ක්ෂය (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**(AAT-AA2 - January 2018)**

## අභ්‍යාසය 92

සීමාසහිත උදේනි (පෞද්ගලික) සමාගම, එහි ව්‍යාපාර මෙහෙයුම් 2019 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලදී. එදිනම, ව්‍යාපාරය එහි මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කිරීමට යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදී. සමාගම, 2019 අප්‍රේල් 01 දින පහත සඳහන් පිරිවැය දරණ ලදී,

| | රු. |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් පිරිවැය | 1,250,000 |
| යන්ත්‍රය ප්‍රවාහනය කිරීමේ පිරිවැය | 10,000 |
| යන්ත්‍රය සවිකිරීමේ පිරිවැය | 8,500 |
| යන්ත්‍රය පරීක්ෂා කිරීම සඳහා සිදුකල නිෂ්පාදිත නියැදියේ පිරිවැය | 10,000 |
| මෙහෙයුම් කටයුතු ප්‍රචාරණය කිරීම සඳහා වූ පිරිවැය | 17,500 |

**ඔබ විසින් කළ යුතු දෑ,**

2019 අප්‍රේල් 01 දිනට යන්ත්‍රය මත ප්‍රාග්ධනිත කළ යුතු පිරිවැය හඳුනා දක්වන්න. (ලකුණු 03)

**(AAT-AA2 - July 2019)**

## අභ්‍යාසය 93

සීමාසහිත ඊගල් (පෞද්ගලික) සමාගම, 2014 අප්‍රේල් 01 දින යන්ත්‍රයක් අත්පත් කරගත් අතර, පහත සඳහන් වියදම් දරා ඇත.

| | රු. |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | 1,325,000 |
| තීරු බදු හා නිෂ්කාශන වියදම | 35,600 |
| සවි කිරීමේ පිරිවැය | 43,900 |

අත්පත් කරගත් දිනට, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම පිළිවෙලින් වර්ෂ 10 ක් සහ රු. 200,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

සමාගම, 2014 දී මුලින් මිල දී ගත් යන්ත්‍රය සඳහා රු. 260,400/- ක පිරිවැයකට වැඩිදියුණු කළ පැකේජයක් 2016 අප්‍රේල් 01 දින, මිල දී ගත්තේ ය. මෙම වැඩි දියුණු කිරීම තුළින්, යන්ත්‍රය භාවිතකොට නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ ඒකකයක නිෂ්පාදන කාලය අඩු කිරීමට මග පෑදී ඇත. වැඩි දියුණු කිරීම හේතුවෙන්, 2016 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 12 ක් බවට ඇස්තමේන්තු කර ඇති අතර අවශේෂ වටිනාකම එලෙස ම පැවතුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**පහත දෑ ගණනය කරන්න.**

(a) යන්ත්‍රයේ වැඩි දියුණු කිරීමට අදාළ ගැලපීම් සටහන් කිරීමෙන් පසු 2016 අප්‍රේල් 01 දිනට යන්ත්‍ර ගිණුමේ දක්වෙන පිරිවැය (ලකුණු 03)

(b) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රය වෙනුවෙන් අය කළ යුතු ක්ෂය (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**(AAT-AA2 - July 2017)**

## අභ්‍යාසය 84

සීමාසහිත ඔරාන් (පෞද්ගලික) සමාගම විසින් 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී එහි ව්‍යාපාරික කටයුතු සඳහා පාවිච්චි කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකරන ලද අතර ඒ සඳහා පහත පිරිවැය දරා ඇත.

| | රු. ('000) |
|---|---|
| භූමිය සැකසීමේ පිරිවැය | 870 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය හා ශ්‍රමය | 1,590 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 160 |
| වෘත්තීය ගාස්තු (වාස්තු විද්‍යා, ඉංජිනේරු සහ නීති) | 630 |
| 2014 වර්ෂය සඳහා මහනගර සභා වරිපනම් | 50 |

ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2013 මාර්තු 31 දින වනවිට නිමකරන ලද අතර 2013 අප්‍රේල් 01 දින සිට ගොඩනැගිල්ල භාවිත කළ හැකි විය. ගොඩනැගිල්ලට අවුරුදු 50 ක ඵලදායී ආයුකාලයක් ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, එය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ,

පහත දෑ ගණනය කරන්න.

(a) 2013 අප්‍රේල් 01 දිනට ඉහත ගොඩනැගිල්ල වෙනුවෙන් ප්‍රාග්ධනිත කළ යුතු වටිනාකම (ලකුණු 03)

(b) 2016 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ ධාරණ අගය (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**(AAT - AA2 - January 2017)**

## අභ්‍යාසය 95

2010 අප්‍රේල් 01 දින සීමාසහිත කෙන් (පෞද්ගලික) සමාගම පහත සඳහන් කොන්දේසි යටතේ යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය.

| | රු. |
|---|---|
| ලැයිස්තුගත මිල | 1,250,000 |
| ප්‍රවාහන පිරිවැය | 55,000 |
| විදුලි සවිකිරීමේ පිරිවැය | 25,000 |
| නිෂ්පාදනයට පෙර පරීක්ෂා පිරිවැය | 20,000 |

ලැයිස්තුගත මිල මත වෙළෙඳ වට්ටම් 20% ක් විය.

යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 8 ක් ලෙස ද, වර්ෂ 8 අවසානයේ අවශේෂ වටිනාකම රු. 20,000/- ක් ලෙස ද ඇස්තමේන්තු කරන ලදී. සමාගම එහි යන්ත්‍ර පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

2014 අප්‍රේල් 01 දින රු. 200,000/- ක් පිරිවැය වූ අලුත් සංරචකයක් එකතු කර යන්ත්‍රය නවීකරණය කිරීමට **සීමාසහිත කෙන් (පෞද්ගලික) සමාගම** තීරණය කළේ ය. මෙම නවීකරණය හේතු කොටගෙන, මෙම යන්ත්‍රය භාවිත කර නිපදවන භාණ්ඩ ඒකකයක නිපදවීමේ කාලය අඩුවිය. නවීකරණය නිසා, යන්ත්‍රයේ ඉතිරිව තිබූ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් දක්වා වැඩි වූ අතර

අවශේෂ වටිනාකම එලෙසම පැවතුණි.

**ඔබ විසින්**, පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2014 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය (carrying value)

(b) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය. (ලකුණු 05)

**(AAT - AA2 - July 2015)**

## අභ්‍යාසය 96

සීමාසහිත සී සෝන් (පෞද්ගලික) සමාගම, රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගමකි. නිමැවුම්වල ගුණත්වය හා නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට අපේක්ෂිත, තාක්ෂණයෙන් උසස් යන්ත්‍රයක අතිරේක ආයෝජනයක් කිරීමට සමාගම තීරණය කළේ ය.

යන්ත්‍රය මිල දී ගැනීම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| දිනය | විස්තරය | මුදල (රු) |
|---|---|---|
| 2014.03.30 | යන්ත්‍රයේ ගැනුම් මිල<br>(මෙම ගැනුම් මිලෙහි අයකර ගත හැකි (recoverable) රු. 120,000/- ක එකතු කළ අගය මත බදු (VAT) ඇතුළත් ය.) | 1,120,000 |
| 2014.03.31 | යන්ත්‍රය ප්‍රවාහනය කිරීමේ පිරිවැය | 125,000 |
| 2014.03.31 | යන්ත්‍රය සවිකිරීමේ සහ අනෙකුත් ඍජු වියදම් | 125,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) යන්ත්‍රය, 2014 අප්‍රේල් 01 දින සිට නිෂ්පාදනය සඳහා සූදානම්ව තිබුණි.

(2) යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 10 කි.

(3) 10 වැනි වර්ෂය අවසානයේ යන්ත්‍රයේ ඇස්තමේන්තුගත විකුණුම් මිල රු. 275,000/- ක් වන අතර, යන්ත්‍රය විකිණීම සඳහා රු. 25,000/- ක පිරිවැයක් දැරීමට සිදුවෙතැයි අපේක්ෂිත ය.

ඔබ විසින්,

(a) යන්ත්‍රයේ ප්‍රාග්ධනිත කළ යුතු මුළු පිරිවැය ගණනය කරන්න.

(b) 2014 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ක්ෂය කළ හැකි වටිනාකම (depreciable value) ගණනය කරන්න.

(c) සරල මාර්ග ක්‍රමය භාවිත කර යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය අය කිරීම ගණනය කරන්න.

(d) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

(i) යන්ත්‍ර ගිණුම,

(ii) ක්ෂය වියදම් ගිණුම,

(iii) ක්ෂය සඳහා වෙන් කිරීමේ ගිණුම

(e) 2015 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ක්ෂය කළ හැකි වටිනාකම ගණනය කරන්න. (ලකුණු 08)

**(AAT - July 2015)**

## අභ්‍යාසය 97

පහත දී ඇති දේපල, පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු 2009 අප්‍රේල් 01 දින ව්‍යාපාර කටයුතු අරඹන ලද සමාගමකට අයත් වේ.

| වත්කම | පිරිවැය රු.'000 | අත්පත් කර ගත් දිනය | අපේක්ෂිත අවශේෂ (residual) අගය රු.'000 |
|---|---|---|---|
| පිරියත (අපේක්ෂිත නිමැවුම = ඒකක මිලියන 3) | 3,000 | 2009.07.01 | 300 |
| වායු සමීකරණ යන්ත්‍රය (පැය 10,400 ක් පාවිච්චි කිරීමට අපේක්ෂා කෙරේ) | 400 | 2009.10.01 | 50 |
| ගොඩනැගිල්ල | 4,000 | 2009.04.01 | - |

2010 මාර්තු 31 දින දක්වා සමාගම ඒකක 600,000 ක් නිෂ්පාදනය කරන ලදී. වායු සමීකරණ යන්ත්‍රය දිනකට පැය 8 බැගින් සතියකට දින 5 ක් අඛණ්ඩව පාවිච්චි කරන ලදී. ගොඩනැගිල්ල එහි පිරිවැය මත වර්ෂයකට 5% බැගින් ක්ෂය කළ යුතු ය. වර්ෂ 5ක් පාවිච්චි කර අනතුරුව එය රු. 1,000,000/- කට විකිණීමේ අපේක්ෂාවෙන් 2010 ජනවාරි 01 දින රු. 3,000,000/- ලොරියක් මිල දී ගන්නා ලදී. කෙසේ වුව ද, ලොරිය මාස දෙකක් පමණක් පාවිච්චි කර රු. 2,800,000/- කට විකුණන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ,

(a) 2010 මාර්තු 31 දිනට ක්ෂය ප්‍රතිපාදන ගිණුම පිළියෙල කිරීම.

(b) 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම් ගිණුම පිළියෙල කිරීම.

(c) 2010 මාර්තු 31 දිනට එක් එක් වත්කමෙහි ලියා හළ අගය සඳහන් කිරීම. (ලකුණු 7 1/2 යි)

**(AAT - December 2010)**

## අභ්‍යාසය 98

සීමාසහිත බිල් සමාගමේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි.

| | 2011.03.31 දිනට පිරිවැය (රු.) | අත්පත් කළ දිනය | ක්ෂය අනුපාතිකය / ක්‍රමය | 2011.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.) |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල | 1,200,000 | 2001.04.01 | වර්ෂයකට 5% බැගින් සරල මාර්ග | 600,000 |
| මෝටර් වාහනය | 950,000 | 2004.09.30 | වර්ෂයකට 15% බැගින් සරල මාර්ග | 926,250 |
| යන්ත්‍ර | 800,000 | 2009.04.01 | වර්ෂයකට 25% බැගින් හීනවන ශේෂ | 350,000 |

පහත සඳහන් තොරතුරු ද ලබා දී ඇතඃ

1. සීමාසහිත බිල් සමාගම 2011 අප්‍රේල් 01 දින රු. 750,000/- පිරිවැයකට මෝටර් වාහනයක් අත්පත් කරගෙන ඇත.
2. සමාගම 2011 සැප්තැම්බර් 30 දින සියලු ම යන්ත්‍ර රු. 410,000/- කට විකුණන ලද අතර, එදිනම රු. 1,000,000/- ට නව අධි තාක්ෂණ යන්ත්‍රයක් අත්පත් කරගෙන තිබේ.

3. දැනට පවත්නා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වර්ෂය තුල මිල දී ගැනීම් සඳහා අනුගමනය කෙරේ.

ඔබ විසින්,

(a) 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම,

(b) යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභය / පාඩුව,

ගණනය කළ යුතු ය. (ලකුණු 7 1/2 යි)

**(AAT - January 2013)**

## අභ්‍යාස 99

**සීමාසහිත** ඇල්ෆා සමාගමට පහත සඳහන් වත්කම් ඇත.

| වත්කම | පිරිවැය රු. | 2009.12.31 දිනට ක්ෂය රු. | අවශේෂ වටිනාකම රු. |
|---|---|---|---|
| යන්ත්‍ර | 210,000 | 98,000 | කිසිවක් නැත |
| මෝටර් රථය | 400,000 | 45,000 | 40,000 |
| උපකරණ | 240,000 | 138,750 | 24,000 |

(1) මෝටර් රථය අත්පත් කරගෙන ඇත්තේ 2009 ජූලි 01 දින ය.

(2) උපකරණ වර්ෂයකට 25% බැගින් හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කරනු ලැබේ. 2009 ජනවාරි 01 දින රු. 20,000/- කට අත්පත් කරගත්, උපකරණයක් (අවශේෂ වටිනාකම් නොමැතියැයි උපකල්පනය කරන්න) 2010 ජූනි 30 දින රු. 8,000/- කට බැහැර කරන ලදී.

(3) 2008 ජනවාරි 01 දින රු. 200,000/- ක මිලකට සමාගම යන්ත්‍රයක් මිලදී ගත්තේ ය. යන්ත්‍රයේ ඵලදායී ආයුකාලය නිෂ්පාදන පැය 30,000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

(4) යන්ත්‍රයේ තථ්‍ය නිෂ්පාදනය පැය පහත පරිදි විය.

| | |
|---|---|
| 2008 | පැය 6,000 |
| 2009 | පැය 8,000 |
| 2010 | පැය 10,000 |

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එක් එක් වත්කම සඳහා වූ ක්ෂය වියදම ගණනය කිරීම.

(b) උපකරණ බැහැර කිරීමේ ගිණුම පිළියෙල කිරීම. (ලකුණු 7 1/2 යි)

**(AAT - July 2011)**

## අභ්‍යාසය 100

සීමිත ඩෙල්ටා සමාගමේ පොත්වලින් පහත සඳහන් ශේෂ උපුටා ගන්නා ලදී.

යන්ත්‍රෝපකරණ:

| විස්තරය | රු. |
|---|---|
| යන්ත්‍රෝපකරණ පිරිවැයට - 2008 මාර්තු 31 දිනට ශේෂය | 6,900,000 |
| ක්ෂය ප්‍රතිපාදනය - 2008 මාර්තු 31 දිනට ශේෂය | 1,187,500 |

2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 2008.04.01 | A - යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1,950,000 |
| 2009.03.01 | B - යන්ත්‍රෝපකරණ විකිණීම | 2,550,000 |
| 2009.03.01 | C - යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 3,750,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා තිබුණි.

(1) 2008 මාර්තු 31 දිනට යන්ත්‍රෝපකරණ ගිණුම සැදී තිබූ ආකාරය මෙසේය:

| මිලදී ගත් දිනය | විස්තරය | මුදල පිරිවැයට (රු.) |
|---|---|---|
| 2005.05.01 | X - යන්ත්‍රෝපකරණ | 2,400,000 |
| 2007.03.01 | B - යන්ත්‍රෝපකරණ | 2,100,000 |
| 2007.03.01 | D - යන්ත්‍රෝපකරණ | 2,400,000 |

(2) සරල මාර්ගික ක්‍රමයට වර්ෂයකට 10% බැගින් යන්ත්‍රෝපකරණ ක්ෂය කළ යුතු විය.

ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින්, 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත ඩෙල්ටා සමාගමේ පහත සඳහන් ලෙජර් ගිණුම් ඔබ විසින් පිළියෙල කළ යුතු ය.

(a) යන්ත්‍රෝපකරණ ගිණුම
(b) යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන ගිණුම
(c) යන්ත්‍රෝපකරණ ඉවත් කිරීමේ ගිණුම
(d) ක්ෂය ගිණුම (ලකුණු 10)

**(AAT - December 2009)**

## අභ්‍යාසය 101

**රෙඩ් කැබ් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි** 2007 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුමෙන් පහත දක්වන ශේෂයන් උපුටාගෙන ඇත.

| | රු. |
|---|---|
| මෝටර් වාහන පිරිවැයට (2007.03.31 දිනට) | 20,880,000 |
| මෝටර් වාහන මත ක්ෂය වෙන් කිරීම (2006.04.01 දිනට) | 8,840,000 |

පහත දැක්වෙන අමතර තොරතුරු සපයා ඇත.

(1) 2006 ජූලි 31 දින, රු. 3,000,000/- කට මිලට ගන්නා ලද වාහනය නිවැරදිව ගිණුම් ගත කර ඇත. එය එම වසර තුළ දී මිලට ගත් එකම වාහනය වේ.

(2) 2004 මාර්තු 31 දින රු. 6,000,000/- ක පිරිවැයකට මිලට ගෙන තිබූ මෝටර් රථයක් **සීමිත සමනල සමාගමෙහි** රු. 2,100,000/- කට අගය කරන ලද මෝටර් කාරයක් සමඟ 2007 මාර්තු 31 දින හුවමාරු කරන ලදී. එහිදී සීමිත සමනල සමාගමෙන් එම මෝටර් කාරයට අමතරව මුදලින් රු. 1,140,000/- ක්ද ලබා ගන්නා ලදී. මෙම ගනුදෙනුව පොත්වල සටහන් කර නොමැත.

(3) සීමිත රෙඩ් කැබ් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් මෝටර් වාහන පිරිවැය මත සරල මාර්ගික ක්‍රමය යටතේ වසරකට 25% බැගින් සත්‍ය වශයෙන් පාවිච්චි කළ කාලය පදනම් කරගෙන ක්ෂය කරනු ලැබේ.

ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය:

(a) මෝටර් වාහන ගිණුම.

(b) මෝටර් වාහන ක්ෂය වෙන්කිරීමේ ගිණුම.

(c) මෝටර් වාහන බැහැර කිරීමේ ගිණුම. (ලකුණු 06)

**(AAT - December 2007)**

## අභ්‍යාසය 102

පහත සඳහන් තොරතුරු XYZ සමාගමේ පොත් වලින් උපුටා ගන්නා ලදී.

මෝටර් රථයක් අනතුරකට පත්වීම නිසා 2010 ජූනි 01 දින රු. 250,000/- විකුණන ලදී. මෙම මෝටර් රථයේ පිරිවැය රු. 750,000/- ක් වන අතර 2007 අප්‍රේල් 01 දින මිල දී ගන්නා ලදී. අනතුර හේතුවෙන් රු. 150,000/- ක රක්ෂණ හිමිකමක් ලැබුණි.

සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය මෝටර් රථ සඳහා වන්නේ වාර්ෂිකව පිරිවැයෙන් 20% ක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමයි.

ඔබ විසින්, මෝටර් රථය බැහැර කිරීමෙන් ඇති වූ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(ලකුණු 02 1/2)

**(AAT - January 2012)**

# හවුල් ව්‍යාපාර ගිණුම්
# Partnership Accounts

## හවුල් ව්‍යාපාර නිර්වචනය

හවුල් ව්‍යාපාරයක් යනු ලාභ ලැබීමේ පරමාර්ථය මත පොදුවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය යි.

## හවුල් ව්‍යාපාරයක තිබිය යුතු අත්‍යවශ්‍ය මූලිකාංග

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

3. ..............................................................................................................................................

4. ..............................................................................................................................................

## හවුල් ව්‍යාපාරවලට අදාල නීතිමය විධිවිධාන

ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් මූලික වශයෙන් අදාල වන්නේ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යි. මෙම පනත එංගලන්තයේ සම්මත වූ ඉංග්‍රීසි නීතියට අදාළ වන්නකි. හවුල් ව්‍යාපාරවල ගිණුම්කරණය සම්බන්ධයෙන් මෙම පනතෙහි 24 වන වගන්තිය හා 42 වන වගන්තිය විශේෂයෙන් ම අදාල වේ.

හවුල් ව්‍යාපාර පනතට අමතරව හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත සඳහන් නීතිමය විධිවිධානයන් ද බලපෑමක් ඇති කරයි.

**(1) 2007 අංක 07 දරණ සමාගම් පනත**

519 වන වගන්තිය : සාමාජිකයින් 20 දෙනෙකුට වැඩි ගණනකින් සමන්විත හවුල් ව්‍යාපාර පවත්වාගෙන යා නොහැකිය. එහෙත් එක් එක් සාමාජිකයා නීතීඥවරයෙකු වන තැනැත්තන්ගෙන් සමන්විත නීතිඥවරයන් ලෙස කටයුතු කරන හෝ එක් එක් සාමාජිකයා වරලත් ගණකාධිකාරීවරයෙකු වන තැනැත්තන්ගෙන් සමන්විත ගණකාධිකාරීවරයන් ලෙස කටයුතු කරන හෝ එක් එක් සාමාජිකයා බලපත්‍රලාභී ස්කන්ධ විනිමය ස්ථානයක සාමාජිකයින් වන තැනැත්තන්ගෙන් සමන්විත බලපත්‍රලාභී ස්කන්ධ විනිමය ස්ථානයක් පවත්වාගෙන යන විට මෙම උපරිම සීමාව අදාල නොවේ. සාමාජික සංඛ්‍යාව 20 කට වඩා වැඩිවන විට එය සමාගමක් ලෙස ලියාපදිංචි කළ යුතු ය.

**(2) 1840 වංචා වැලැක්වීමේ ආඥා පනත**

හවුල් ව්‍යාපාරයක ආරම්භක මුළු ප්‍රාග්ධනය රු. 1,000 ට වැඩි නම් එය ලිඛිතව හවුල් ගිවිසුමක් පදනම් කරගෙන පවත්වාගෙන යා යුතු ය.

**(3) පළාත් සභාවල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ප්‍රඥප්තිය**

හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමට අදාළ විධිවිධාන මෙහි සඳහන් වේ.

## හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර අන්‍යොන්‍ය එකඟතාවයක් ඇතිවීම අවශ්‍ය වේ. ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු ආකාරයත් හවුල්කරුවන් එකිනෙකාගේ අයිතිවාසිකම්, බලතල හා වගකීම් පිළිබඳවත් ඔවුන් අතර එකඟතාවයක් ඇති කරගත යුතුය. මෙවැනි එකඟතාවයක් කටවචනයෙන් හෝ ඇඟවීමෙන් (හැසිරීමෙන්) වුව ද ඇති කරගත හැකි නමුත් ලිඛිතව එනම් ලියවිල්ලක් මගින් එකඟතාවයක් ඇති කරගැනීම වඩා යෝග්‍ය වේ.

හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා යුතු ආකාරයත් හවුල්කරුවන්ගේ අයිතිවාසිකම්, බලතල හා වගකීම් පිළිබඳවත් හවුල්කරුවන් පොදුවේ එකඟවන්නා වූ කොන්දේසි ඇතුලත් කරමින් පිළියෙල කළ හවුල්කරුවන් සියලු දෙනා ම අත්සන් කරනු ලැබූ ලියවිල්ල **හවුල් ඔප්පුව** නම් වේ. මෙවැනි හවුල් ඔප්පුවක ඇති වැදගත්කම වනුයේ හවුල්කරුවන් අතර ඇතිවිය හැකි මතභේද හැකිතාක් දුරට අවම කරගැනීමටත් යම් මතභේදයක් ඇති වුවහොත් එය හවුල් ඔප්පුවෙහි සඳහන් කොන්දේසි අනුව නිරාකරණය කරගැනීමටත් හැකියාව ලැබීම යි.

හවුල් ඔප්පුවක රටේ පවත්නා පොදු නීතියට පටහැනි නොවන හවුල්කරුවන් එකඟවන ඕනෑම කරුණක් ඇතුළත් කළ හැකි ය. සාමාන්‍යයෙන් හවුල් ඔප්පුවක ඇතුලත් වන පොදු කරුණු කීපයක් පහත සඳහන් වේ.

(1) එක් එක් හවුල්කරු විසින් යොදවනු ලබන ප්‍රාග්ධනය.

(2) හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදාගන්නා ආකාරය.

(3) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සඳහා පොලී හිමිවනවා ද යන්න හා පොලී හිමි වන්නේ නම් වාර්ෂික පොලී ප්‍රතිශතය.

(4) හවුල්කරුවන්ගේ ශ්‍රමය සඳහා වැටුප් හෝ කොමිස් හිමිවන්නේ ද යන්න හා හිමිවන්නේ නම් වාර්ෂික වැටුප හෝ කොමිස් ප්‍රමාණය.

(5) ගැනිලි සම්බන්ධයෙන් හවුල්කරුවන්ට තිබෙන හිමිකම.

(6) හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා පොලී අයකරනවා ද යන්න හා පොලී අයකරන්නේ නම් වාර්ෂික පොලී ප්‍රතිශතය.

(7) හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ණය සම්බන්ධයෙන් හවුල්කරුවන්ට හිමි වාර්ෂික පොලී ප්‍රතිශතය.

(8) නව හවුල්කරුවෙකු බඳවා ගැනීම සම්බන්ධයෙන් බලපාන කොන්දේසි.

(9) හවුල්කරුවෙකු ඉවත්ව යාම සම්බන්ධයෙන් බලපාන කොන්දේසි.

(10) නව හවුල්කරුවෙකු බඳවා ගන්නා විටෙක හෝ හවුල්කරුවෙකු ඉවත්ව යන විටෙක ව්‍යාපාරයේ කීර්තිනාමය ගණනය කළ යුතු ආකාරය හා එය ගිණුම්ගත කළ යුතු ආකාරය.

## හවුල් ව්‍යාපාර පනතේ 24 වන වගන්තිය

හවුල් ව්‍යාපාරවල හවුල්කරුවන් විසින් කටවචනයෙන් හෝ ඇඟවීමෙන් හෝ ලිඛිතව ගිවිසුමකින් හෝ එකඟතාවයක් ඇති කරගෙන නොමැති කරුණු සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාර පනතේ 24 වන වගන්තියේ ඇතුලත් විධිවිධානය බලපායි. එම විධිවිධානයන් පහත සඳහන් වේ.

(1) ව්‍යාපාර ආයතනයේ ප්‍රාග්ධනයෙන් හා ලාභයෙන් සමාන කොටස් ලැබීමට සියලු ම හවුල්කරුවන්ට හිමිකම ඇති අතර ව්‍යාපාර ආයතනය විසින් දැරීමට සිදුවන අලාභ ද සමානව දැරීමට එකඟ විය යුතු ය.

(2) ව්‍යාපාර ආයතනයේ කටයුතු සාමාන්‍ය වශයෙන් හෝ නිසි පරිදි පවත්වාගෙන යන විට දී හෝ ව්‍යාපාරය හෝ ව්‍යාපාර ආයතනයේ දේපල ආරක්ෂා කිරීම සඳහා යම් හවුල්කරුවෙකු විසින් ගෙවූ යම් මුදලක් හෝ දැරූ යම් පෞද්ගලික වගකීමක් සම්බන්ධයෙන් ව්‍යාපාර ආයතනය ඔහු නිදහස් කළ යුතු ය.

(3) හවුල් ව්‍යාපාරයේ කාර්යයන් සඳහා දායක වීමට තමා ගිවිසගත් ප්‍රාග්ධනයට අමතරව යම් මුදලක් (ණය මුදලක්) ලබාදෙන හවුල්කරුවෙකුට එය ලබා දුන් දිනයේ සිට වර්ෂයකට 5% බැගින් පොලියක් ලැබීමට හිමිකම ඇත.

(4) ලාභ නිශ්චය කිරීමට ප්‍රථමයෙන් තමන් විසින් දායක වූ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් නොලබයි.

(5) හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සෑම හවුල්කරුවකු ම සහභාගී විය යුතුය.

(6) හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් වේතනයක් ලැබීමට කිසිම හවුල්කරුවෙකු හිමිකම් නොලබයි.

(7) එවකට සිටින සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව නව හවුල්කරුවකු බඳවා ගත නොහැකි ය.

(8) හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් සාමාන්‍ය කරුණුවලින් පැන නගින මතභේදයන් හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කළ හැකි වුව ද එවකට සිටින සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව හවුල් ව්‍යාපාරයේ ස්වාභාවය පිළිබඳ කිසියම් වෙනසක් කළ නොහැකි ය.

(9) හවුල් ව්‍යාපාරයේ පොත්පත් ව්‍යාපාරය පවත්වන ස්ථානයේ (ස්ථාන එකකට වැඩි ගණනක් ඇත්නම් එයින් ප්‍රධාන ස්ථානයේ) තැබිය යුතු අතර සෑම හවුල්කරුවෙකුට ම සුදුසු යැයි තමා සිතන විටෙක දී ඒවා පරීක්ෂා කිරීමටත් අවශ්‍ය දෙයක් පිටපත් කර ගැනීමටත් හිමිකම් ලබයි.

## අභ්‍යාසය 111

01. පහත සඳහන් ප්‍රකාශන, 1890 හවුල් ව්‍යාපාර ආඥා පන්තේ 24 වන වගන්තියට අදාල වේ.

(a) සියලූ ම හවුල්කරුවන් සමාන ලෙස ප්‍රාග්ධනයට දායක විය යුතුය.

(b) හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සෑම හවුල්කරුවෙකුම සහභාගි විය හැක.

(c) හවුල් ව්‍යාපාරයට නව හවුල්කරුවෙකු බඳවා ගැනීම සඳහා දැනට සිටින හවුල්කරුවන්ගේ අනුමැතිය අවශ්‍ය නොවේ.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ,

(1) (a) සහ (b) පමණි (2) (a) පමණි

(3) (a) සහ (c) පමණි (4) ඉහත සඳහන් සියල්ල ම

**(AAT - July 2019)**

02. 1890 හවුල්ව්‍යාපාර ආඥා පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න.

(a) සියලූ ම හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක විය යුතු යි.

(b) දැනට සිටින සියලූ ම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව අලුත් හවුල්කරුවෙකු ව්‍යාපාරයට ඇතුළත් කර නොගත යුතු ය.

(c) හවුල් ව්‍යාපාරයේ වැඩ කිරීම වෙනුවෙන් පාරිශ්‍රමිකයකට / වේතනයකට (remuneration) හවුල්කරුවෙකු හිමිකම් ලැබිය යුතු යි.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ,

(1) (a) සහ (b) පමණි (2) (a) පමණි

(3) (b) සහ (c) පමණි (4) ඉහත සඳහන් සියල්ල ම

**(AAT - July 2017)**

03. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව, පහත එක් එක් අයිතමය සඳහා අදාල ප්‍රතිපාදන සඳහන් කරන්න.

(1) නව හවුල්කරුවෙක් හඳුන්වා දීම.

(2) ප්‍රාග්ධනයට අමතර අත්තිකාරම් සඳහා පොලිය.

(3) හවුල් ව්‍යාපාරයේ පොත්පත්. (ලකුණු 06)

**(AAT - January 2017)**

04. 1890 හවුල් ව්‍යාපාරය ආඥා පනතේ 24 වන වගන්තියේ (section 24) විධිවිධාන (provisions) තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 03)

**(AAT - July 2016)**

05. පහත දෑ සම්බන්ධයෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන සඳහන් කරන්න.
(a) ප්‍රාග්ධන පොලිය
(b) හවුල්කරුවන්ගේ වැටුප් (remuneration) (ලකුණු 04)

**(AAT - January 2016)**

06. වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුව, හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සඳහන් කරන්න. (ලකුණු 02)

**(AAT - July 2015)**

## හවුල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය

හවුල්කරුවෙකු මිය යාමෙන් හෝ වෙනත් ආකාරයකට හවුල්කරුවෙකු වශයෙන් සිටීම අවසන් වීමෙන් හෝ ව්‍යාපාරයෙන් ඉවත්ව යන හවුල්කරුවෙකුට හිමි මුදලය ඒ අවස්ථාවේ දී ම නොගෙවන්නේ නම් හවුල් ව්‍යාපාරයේ වත්කම් සඳහා එම හවුල්කරුගේ හිමිකම් යොදා ගැනීම වෙනුවෙන් අධිකරණයක් විසින් තීරණය කරනු ලබන පරිදි වර්ෂයකට 5% බැගින් වූ පොලියක් හෝ ලාභ කොටසක් හවුල්කරුට හෝ ඔහුගේ / ඇයගේ උරුමක්කරුවන්ට ලැබීමට හිමිකම ඇත.

## ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් භාවිතය සහ ලාභ විසර්ජනය

හවුල් ව්‍යාපාරවල ගිණුම් තැබීම ඒක පුද්ගල ව්‍යාපාරවල ගිණුම් තැබීමට බොහෝ දුරට සමානය. විශේෂයෙන් ම සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනුවලින් පැන නගින්නා වූ ගිණුම් ඒක පුද්ගල ව්‍යාපාරයකත් හවුල් ව්‍යාපාරයකත් එක හා සමාන වන අතර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම ද බොහෝ දුරට සමාන ස්වභායක් පෙන්වයි. එහෙත් ඒක පුද්ගල ව්‍යාපාරයක ගිණුම් හා සසඳන විට හවුල් ව්‍යාපාරයක ගිණුම්වල පහත සඳහන් වෙනස්කම් දැකිය හැකි ය.

(1) ඒක පුද්ගල ව්‍යාපාරයක අයිතිකරු වෙනුවෙන් තබා ගන්නා ප්‍රධානතම ගිණුම ප්‍රාග්ධන ගිණුම පමණක් වුවත් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් වෙනුවෙන් පහත සඳහන් ගිණුම් වෙන වෙනම පවත්වාගනු ලැබේ.

i) ..........................................................................
ii) ..........................................................................
iii) ..........................................................................
iv) ..........................................................................

(2) ඒක පුද්ගල ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශයෙන් ලැබෙන ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය සෘජුවම අයිතිකරුගේ ප්‍රග්ධන ගිණුමට මාරු කරනු ලැබුවත් හවුල් ව්‍යාපාරයක ලැබෙන ශුද්ධ ලාභය හෝ අලාභය විසර්ජන ගිණුමක් භාවිතයෙන් සාධාරණව බෙදාහැරීම සිදු වේ.

## ප්‍රාග්ධන ගිණුම්

හවුල් ව්‍යාපාරයක් හවුල්කරුවන් වෙනුවෙන් ප්‍රාග්ධන ගිණුම් වෙත වෙන ම පවත්වා ගැනීම අවශ්‍ය වේ. එක් එක් හවුල්කරු ප්‍රාග්ධනය වෙනුවෙන් මුදලින් හෝ වෙනත් වත්කම්වලින් හෝ දායක වූ ප්‍රමාණය ඔහු නමින් වන ප්‍රාග්ධන ගිණුමකට බැර කෙරේ. ප්‍රාග්ධනයට දායක වන ප්‍රමාණය හා ප්‍රාග්ධන අයිතමයන් පමණක් ප්‍රාග්ධන ගිණුමේ පවත්වාගෙන යන අවස්ථාවක මෙම ගිණුම් හඳුන්වන්නේ ස්ථාවර ප්‍රාග්ධන ගිණුම් යනුවෙනි.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී, වේතන, කොමිස්, ලාභ කොටස්, ගැනිලි හා ගැනිලි පොලී යනාදිය ද අවශ්‍ය නම් ප්‍රාග්ධන ගිණුම්වල ම සටහන් කළ හැකිය. එසේ කළහොත් ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් නිතර අඩු වැඩි වේ. හවුල්කරුවන්ට විවිධ ස්වරූපවලින් ලැබෙන ලාභත් ඔවුන්ගේ ගැනිලිත් ප්‍රාග්ධන ගිණුමේ ඇතුලත් කළහොත් ඔවුනට හිමි ලාභ කොටසට වඩා වැඩි ප්‍රමාණයක් ව්‍යාපාරයෙන් ඉවත් කර ගැනීම ද නොදැනුවත්ව ම සිදුවීමට ඉඩ ඇත. මෙවිට ඇත්ත වශයෙන් ම සිදුවන්නේ ප්‍රාග්ධනයෙන් කොටසක් ඉවත් කර ගැනීම යි. ප්‍රාග්ධන ශේෂ මෙලෙස නිතර නිතර වෙනස් වීම හවුල්කරුවන් අතර නොයෙකුත් මතභේද ඇති වීමට තුඩු දෙන කරුණක් විය හැකිය. ඒ නිසා බොහෝ හවුල් ව්‍යාපාර ප්‍රාග්ධන ගිණුම් ස්ථාවරව පවත්වාගෙන යයි. ස්ථාවර ප්‍රාග්ධන ගිණුමක ඇතුලත් කෙරෙන අයිතිම පහත දැක්වේ.

i) ..........................................................................................................................................

ii) ..........................................................................................................................................

iii) ..........................................................................................................................................

iv) ..........................................................................................................................................

(උදා : කීර්තිනාමය, ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ)

ප්‍රාග්ධන ගිණුම්

| | අමල් (රු.) | බිමල් (රු.) | | අමල් (රු.) | බිමල් (රු.) |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ආපසු ගැනීම් | xxx | xxx | ශේෂය ඉ/ගෙ | xxx | xxx |
| ප්‍රත්‍යාගණන අලාභ | xxx | xxx | මුදල් (ප්‍රාග්ධනය හඳුන්වා දීම්) | xxx | xxx |
| කීර්තිනාමය (හර කිරීම්) | xxx | xxx | කීර්තිනාමය (බැර කිරීම්) | xxx | xxx |
| ශේෂය ප/ගෙ | xxx | xxx | ප්‍රත්‍යාගණන ලාභ | xxx | xxx |
| | xxx | xxx | | xxx | xxx |
| | | | ශේෂය ඉ/ගෙ | xxx | xxx |

## ජංගම ගිණුම්

ප්‍රාග්ධන ගිණුම් ස්ථාවරව පවත්වාගෙන යන අවස්ථාවේ දී හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී, වේතන, කොමිස්, ලාභ කොටස්, ගැනිලි හා ගැනිලි පොලී යනාදිය සටහන් කිරීම සඳහා එක් එක් හවුල්කරු වෙනුවෙන් පවත්වාගෙන යන ගිණුම් ජංගම ගිණුම් යනුවෙන් හැඳින්වේ. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී, වේතන, කොමිස්, ලාභ කොටස් ආදී ඔවුන්ගේ අයහාර හිමිකම් ජංගම ගිණුම්වලට බැර කෙරෙන අතර ගැනිලි, ගැනිලි පොලී, අලාභ කොටස් ආදී අයහාර හිමිකම් අඩුවීම් ජංගම ගිණුම්වලට හර කෙරේ. ජංගම ගිණුම්වල ශේෂ මත පොලී දීම හෝ අයකිරීම හෝ සිදු වේ නම් ඒ පොලී ප්‍රමාණය අදාල පරිදි ජංගම ගිණුමට බැර හෝ හර කෙරේ.

ජංගම ගිණුම්

| | අමල් (රු.) | බිමල් (රු.) | | අමල් (රු.) | බිමල් (රු.) |
|---|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | xxx | | ශේෂය ඉ/ගෙ | | xxx |
| ගැනිලි | xxx | xxx | ප්‍රාග්ධන පොලී | xxx | xxx |
| ගැනිලි පොලී | xxx | xxx | ජංගම ගිණුම් බැර ශේෂ මත පොලී | xxx | xxx |
| ජංගම ගිණුම් හර ශේෂ මත පොලී | xxx | xxx | හවුල් වේතන | xxx | xxx |
| අලාභ කොටස් | xxx | xxx | ලාභ කොටස් | xxx | xxx |
| ශේෂය ප/ගෙ | xxx | xxx | | | |
| | xxx | xxx | | xxx | xxx |
| | | | ශේෂය ඉ/ගෙ | xxx | xxx |

සමහර කුඩා ව්‍යාපාර ජංගම ගිණුම් පවත්වා නොගන්නා අතර හවුල්කරුවන්ගේ සියලු ම හිමිකම් ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල ම සටහන් කරනු ලබයි.

## ගැනිලි ගිණුම්

හවුල්කරුවන් සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ලබා ගන්නා මුදල් හා භාණ්ඩ හවුල්කරුවන්ගේ ගැනිලි වශයෙන් හැඳින්වේ. හවුල්කරුවන්ගේ ගැනිලි ඔවුන්ගේ ජංගම ගිණුම්වලට අදාල අවස්ථාවේ දී ම හර කළ හැකි නමුත් සාමාන්‍යයෙන් කෙරෙන්නේ ඒ ඒ හවුල්කරු නමින් වූ ගැනිලි ගිණුමකට එය පළමුවෙන් හර කර ගිණුම් කාලච්ඡේදය අවසානයේ දී එහි ශේෂය (මුලු ගැනිලි) අදාල හවුල්කරුගේ ජංගම ගිණුමට මාරු කිරීම යි. හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා සීමා පනවා ඇති විටත් ගැනිලි සඳහා පොලී අය කෙරෙන විටත් ගැනිලි පිළිබඳ සම්පූර්ණ විස්තර ලබා ගැනීම පහසු වීම සඳහා වෙනම ගැනිලි ගිණුම් පවත්වා ගැනීම වඩා යෝග්‍ය වේ. ගැනිලිවලට අදාල

ද්විත්ව සටහන් පහත දැක්වේ.

i) මුදල් ගැනිලි

..........................................................................................................

..........................................................................................................

ii) භාණ්ඩ ගැනිලි

..........................................................................................................

..........................................................................................................

## හවුල්කරුවන්ගේ ණය ගිණුම්

හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව ණය හෝ අත්තිකාරම් හෝ වශයෙන් ව්‍යාපාරයට සපයන මුදල් ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම්වලට බැර නොකර ඒ ඒ හවුල්කරු නමින් වූ ණය ගිණුමකට බැර කළ යුතුය. 1890 හවුල් ව්‍යාපාර පනත අනුව හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමේ දී හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය ආපසු ගෙවීමට පෙර ඔවුන්ගේ ණය හා අත්තිකාරම් ආපසු ගෙවිය යුතු නිසා මෙසේ වෙනම ණය ගිණුම් පවත්වාගෙන යාම වැදගත් වේ. හවුල්කරුවන්ගේ ණය සහ අත්තිකාරම්වලට අදාල පොලිය පිළිබඳ කොන්දේසි හවුල් ගිවිසුමේ ඇත්නම් ඒ අනුව අදාල හවුල්කරුට පොලී හිමි වේ. එවැනි කොන්දේසියක් නැති අවස්ථාවක දී 1890 හවුල් ව්‍යාපාර පනතේ 24 වන වගන්තිය අනුව එවැනි ණය හෝ අත්තිකාරම් සඳහා 5% බැගින් වාර්ෂික පොලියක් හිමි වේ.

## ලාභාලාභ විසර්ජනය

හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම ඒක පුද්ගල ව්‍යාපාරයක එම ගිණුම් පිළියෙල කරන ආකාරයට ම සිදු වේ. එහෙත් ඒක පුද්ගල ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශයෙන් සොයා ගන්නා ශුද්ධ ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයෙන් ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබුවත් හවුල් ව්‍යාපාරයක අයිතිකරුවන් කිහිප දෙනෙකු සිටින බැවින් ගිවිසගත් පිළිවෙල අනුව ශුද්ධ ලාභය හෝ අලාභය බෙදිය යුතුය. මේ සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම නමින් වූ විශේෂ කොටසක් ලාභාලාභ ගිණුමට පහලින් පිළියෙල කෙරේ. හවුල් ව්‍යාපාරයක ශුද්ධ ලාභය හෝ අලාභය හෝ ලාභාලාභ විසර්ජන ගිණුමේ ඉදිරියට ගෙන යන අතර හවුල්කරුවන්ට ලැබෙන ප්‍රතිලාභ ද ඔවුන්ගෙන් කෙරෙන අය කිරීම් ද ලාභාලාභ විසර්ජන ගිණුම මගින් ගලපනු ලැබේ. ලාභාලාභ විසර්ජන ගිණුමේ සාමාන්‍යයෙන් ඇතුලත් වන අයිතම පහත දැක්වේ.

i) ..........................................................................................

ii) ..........................................................................................

iii) ..........................................................................................

iv) ..........................................................................................

v) ..........................................................................................

මේවායින් ගැනිලි පොලී හැරෙන්නට අනෙකුත් සියලු ම විසර්ජනයන් ලාභාලාභ විසර්ජන ගිණුම හර - හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් බැර වශයෙන් සටහන් කරනු ලබන අතර ගැනිලි පොලී පමණක් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හර - ලාභාලාභ විසර්ජන ගිණුම බැර යනුවෙන් සටහන් කරනු ලබයි.

A, B, C හවුල් ව්‍යාපාරය
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| ශුද්ධ ලාභය/ ශුද්ධ අලාභය | | | xxxx |
| (+) ගැනිලි පොලී | A | xxxx | |
| | B | xxxx | |
| | C | xxxx | xxxx |
| (+) ජංගම ගිණුම් හර ශේෂ මත පොලී | A | | xxxx |
| | | | xxxx |
| (-) ප්‍රාග්ධන පොලී | A | xxxx | |
| | B | xxxx | |
| | C | xxxx | (xxxx) |
| (-) හවුල්කරුවන්ගේ වේතන | A | xxxx | |
| | B | xxxx | |
| | C | xxxx | (xxxx) |
| (+) ජංගම ගිණුම් බැර ශේෂ මත පොලී | B | xxxx | |
| | C | xxxx | (xxxx) |
| (-) සංචිත වලට මාරු කිරීම් | | | (xxxx) |
| (-) ලාභ කොටස් | A | xxxx | |
| | B | xxxx | |
| | C | xxxx | (xxxx) |
| | | | - |

## ප්‍රාග්ධන පොලී

බොහෝ හවුල් ව්‍යාපාර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් යම් නිශ්චිත පොලියක් ගෙවයි. ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවන්නේ නම් ඒ කවර අනුපාතයකට ද යන්න හවුල් ගිවිසුමේ කොන්දේසි අනුව තීරණය වේ. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් පොලී ගෙවීම පිළිබඳ කිසිවක් හවුල් ගිවිසුමේ සඳහන් නොවේ නම් හවුල් ව්‍යාපාර පනත අනුව ප්‍රාග්ධනය වෙනුවෙන් පොලී ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් නැත.

සාමාන්‍යයෙන් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයට පොලියක් ගෙවීම සාධාරණ යැයි සැලකෙන්නේ හවුල්කරුවන් දායක වී ඇති ප්‍රාග්ධනයට අනුපාතිකව ලාභාලාභ බෙදා නොගන්නා අවස්ථාවක දී ය. එනම් ප්‍රාග්ධන අනුපාතය හා ලාභාලාභ බෙදා ගන්නා අනුපාතය එකිනෙකට වෙනස් නම් ප්‍රාග්ධන පොලියක් ගැලපීම සාධාරණ වේ. ප්‍රාග්ධනය සඳහා වර්ෂය තුළ දී කර ඇති අතිරේක ආයෝජන ද ප්‍රාග්ධනය ඉවත් කර ගැනීම් ද සැලකිල්ලට ගනිමින් ව්‍යාපාරය ප්‍රාග්ධනය ප්‍රයෝජනයට ගෙන ඇති කාලය සඳහා ප්‍රාග්ධන පොලී සාමාන්‍යයෙන් ගණනය කෙරේ. යම්කිසි ගිණුම් වර්ෂයක ආදායම් ප්‍රකාශයෙන් දැක්වෙන ශුද්ධ ලාභය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී ගෙවීමට තරම්වත් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී වුව ද හවුල් ගිවිසුමේ වෙනත් පටහැනි කොන්දේසියක් නැත්නම් සම්පූර්ණ ප්‍රාග්ධන පොලී සාමාන්‍ය ලෙස ගණනය කර ගිණුම්ගත කළ යුතුය. ඉන් පසු ලැබෙන අලාභය ලාභාලාභ අනුපාතය අනුව හවුල්කරුවන් අතර බෙදාහැරිය යුතු ය.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

## අභ්‍යාසය 112

මාධවී, නිමේෂා හා රංගිකා හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. 2015 අප්‍රේල් 01 වන දිනට ඔවුන්ගේ ප්‍රාග්ධන ශේෂ පිළිවෙලින් රු. 600,000 , රු. 500,000 හා රු. 400,000 බැගින් විය. ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් කියනු ලැබේ.

2016 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ පහත සඳහන් පරිදි වෙනස් විය.

**නිමේෂා** – 2015 අගෝස්තු 30 වන දින රු. 60,000 ක අමතර ප්‍රාග්ධනයක් හඳුන්වා දෙන ලදි.

**රංගිකා** – 2015 ජූනි 01 වන දින ඇගේ ප්‍රාග්ධනයෙන් රු. 30,000 ක් ආපසු ගත් අතර 2015 දෙසැම්බර් 31 වන දින රු. 100,000 ක අමතර ප්‍රාග්ධනයක් හඳුන්වා දෙන ලදි.

**ඔබ විසින්,**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන ශේෂ මත පොලිය ගණනය කළ යුතු ය.

## හවුල්කරුවන්ගේ වේතන හා කොමිස්

සමහර හවුල්කරුවෝ ව්‍යාපාරයේ කටයුතු සඳහා පූර්ණ කාලය යෙදවති. එසේ නැතහොත් අනෙක් හවුල්කරුවන්ට වඩා ක්‍රියාකාරී ලෙස ඒ කටයුතුවලට සහභාගී වෙති. මෙසේ ව්‍යාපාරයේ කටයුතු වෙනුවෙන් අනෙක් හවුල්කරුවන්ට වඩා කාලය හා ශ්‍රමය වැය කරන හවුල්කරුවන්ට ඒ සඳහා වැඩි අනුපාතයකට ලාභ බෙදීම වෙනුවට ස්ථිර වේතනයක් ගෙවීම සාමාන්‍යයෙන් සිදු වේ. සියලු ම හවුල්කරුවන් එක සේ ක්‍රියාකාරීව ව්‍යාපාර කටයුතුවලට සහභාගී වන අවස්ථාවල දී ද ව්‍යාපාරයේ නිවැරදි ලාභය ගණනය කිරීමේ අරමුණින් හවුල්කරුවන්ගේ සේවය සඳහා ප්‍රමාණවත් වේතන ගෙවීම ද සිදු වේ. තව ද යම් යම් විශේෂ සේවාවන් ඉටු කිරීම වෙනුවෙන් (උදාඃ විකුණුම් ප්‍රවර්ධනය) සමහර හවුල්කරුවන්ට කොමිස් ගෙවීම ද සිදු වේ. හවුල්කරුවන්ගේ වේතන හා කොමිස් ගෙවීම සඳහා අවශ්‍ය කොන්දේසි හවුල් ගිවිසුමේ ඇතුලත් විය යුතුය. වේතන හෝ කොමිස් ගෙවීම පිළිබඳ කොන්දේසි හවුල් ගිවිසුමේ ඇතුලත් නොවේ නම් හවුල්කරුවන්ගේ සේවය වෙනුවෙන් වේතන හෝ කොමිස් ලැබීමට හවුල් ව්‍යාපාර පනත අනුව ඔවුනට හිමිකමක් නැත.

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

........................................................................................................................................................................

## ගැනිලි පොලී

හවුල්කරුවන්ගේ ගැනිලි අන්‍යෝන්‍ය එකඟතාව මත සාමාන්‍යයෙන් සිදුවන අතර ඒ සඳහා පොලී බොහෝ විට අය නොකෙරේ. එහෙත් හවුල්කරුවන් නිතර නිතර අක්‍රමවත් කාල ප්‍රාන්තරවල දී විවිධ ප්‍රමාණවලින් ගැනිලි කරයි නම් එය එක් අතකින් ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු සඳහා ඇති කාරක ප්‍රාග්ධනය අනවශ්‍ය ලෙස ඉවත් කර ගැනීමක් වෙයි. අනෙක් අතින් එය අඩුවෙන් ගැනිලි කරන හවුල්කරුවනට අවාසි සහගත තත්ත්වයක් උදා කරන්නක් වෙයි. හවුල්කරුවන් අනවශ්‍ය ලෙස ව්‍යාපාරයේ මුදල්, ගැනිලි ලෙස ව්‍යාපාරයෙන් ඉවත් කර ගැනීම අධෛර්‍යමත් කිරීම සඳහාත් හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් නිසි ලෙස ගැලපීම සඳහාත් ඇතැම් හවුල් ව්‍යාපාරවල හවුල් ගිවිසුමෙහි සඳහන් විධිවිධානයන්ට අනුව ගැනිලි වෙනුවෙන් පොලී අය කරයි. සාමාන්‍යයෙන් ගැනිලි සඳහා පොලී අය කරන්නේ ඒ ඒ ගැනිලි සිදු වූ දින සිට ගිණුම් කාලච්ඡේදය අවසානය තෙක් වූ කාලය සඳහා යම් නිශ්චිත වාර්ෂික පොලී ප්‍රතිශතයක් මතය. හවුල්කරුවන්ගේ ගැනිලි සෑම මාසයක දී ම එක ම දින දී සමාන ප්‍රමාණවලින් සිදු වේ නම් පමණක් ගැනිලිවලට අදාල සාමාන්‍ය කාලය සෙවීමෙන් එකී පොලී පහසුවෙන් ගණනය කළ හැකි ය. මේ අනුව වර්ෂයක් පුරා,

i) සෑම මාසයක ම ආරම්භයේ දී ම සමාන ප්‍රමාණවලින් ගැනිලි ලබාගෙන තිබේ නම් ගැනිලි පිළිබඳ සාමාන්‍ය කාලය මාස 6 1/2 කි.

ii) සෑම මාසයක ම මැද දී සමාන ප්‍රමාණවලින් ගැනිලි ලබාගෙන තිබේ නම් ගැනිලි පිළිබඳ සාමාන්‍ය කාලය මාස 6 කි.

iii) සෑම මාසයක ම අවසානයේ දී ම සමාන ප්‍රමාණවලින් ගැනිලි ලබාගෙන තිබේනම් ගැනිලි පිළිබඳ සාමාන්‍ය කාලය මාස 5 1/2 කි.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

## අභ්‍යාසය 113

ගයාන්, සහන්, කාවිංග, නිමේෂා, මධුරි සහ වාසනා ලාභාලාභ සමව බෙදා ගන්නා හවුල්කරුවෝ වෙති. 2016/03/31 න් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවෝ පහත පරිදි ගැනිලි සිදුකර ඇත.
ගයාන් රු. 1,000 බැගින් සෑම මසක ම මුල දී, සහන් රු. 3,000 බැගින් සෑම මසක ම අග දී, කාවිංග රු. 1,000 බැගින් සෑම මසක ම මැද දී, නිමේෂා රු. 3,000 බැගින් සෑම කාර්තුවක් ආරම්භයේ දී, මධුරි රු. 2,500 බැගින් සෑම කාර්තුවක් අවසානයේ දී ම සහ වාසනා රු. 4,000 බැගින් සෑම කාර්තුවක් මැදදී ගැනිලි සිදුකර ඇත. ගිවිසුම අනුව ගැනිලි පොළී වාර්ෂිකව 10% ක් අය කරනු ලැබේ.
එකිනෙක හවුල්කරුගේ ගැනිලි පොළිය ගණනය කරන්න.

**පිළිතුර**

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**01. ගැනිලි කළ දිනය ලබා දී නොමැති නම්,**

මෙහි දී සම්පූර්ණ වර්ෂය සඳහා පොලිය අය කළ යුතු අතර එය පහත පරිදි ගණනය කෙරේ.

..........................................................................................................................

## අභ්‍යාසය 114

හවුල්කරුවකු වන අයේෂා රු. 10,000 ක් ගැනිලි වශයෙන් ලබාගෙන ඇත. ගැනිලි මත වාර්ෂිකව 6% ක් පොලිය අය කරනු ලැබේ. ගැනිලි පොලිය ගණනය කරන්න.

..........................................................................................................................

**02. ගැනිලි කළ දිනය ලබා දී ඇත්නම්,**

ගැනිලි සිදුකළ දිනය පිළිබඳ තොරතුරු පවතී නම්, ව්‍යාපාරයෙන් පිටත මුදල් තිබුණු කාලය ගැන සලකා පොලිය ගණනය කළ යුතු වේ. හවුල්කරුවන්ට විවිධ ප්‍රමාණයන් විවිධ කාල පරාසයන් තුල දී ලබාගත හැක. සමහරවිට සමාන කාල පරාසයන් අතරතුර මුදල් ආපසු ලබා ගත හැක.

**වෙනස් අගයන් වෙනස් කාල පරාසයන්වල දී ආපසු ලබාගෙන ඇති විට**

මෙහි දී ගැනිලි පොලී ගණනය කිරීම සඳහා එකිනෙක ගැනිලි ප්‍රමාණය සහ අදාල දින / මාස ගණන (ගැනිලි සිදු කළ දිනයේ සිට මූල්‍ය ප්‍රකාශ අවසාන දිනය දක්වා) එකිනෙකින් වැඩි කරනු ලැබේ. එය පහත ආකාරයට ගණනය කළ හැකි ය.

..........................................................................................................................

## අභ්‍යාසය 107

ජූනි 30 වන දින රු. 10,000 ක් සහ ජනවාරි 02 වන දින රු. 15,000 ක් ගැනිලි වශයෙන් ලබා ගත් සමන් හවුල්කරුවකු වන අතර ගැනිලි පොලී වර්ෂයකට 12% ක් අය කරනු ලැබේ. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනිලි පොලිය ගණනය කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

## හවුල් ව්‍යාපාර අවසාන ගිණුම්වලට අදාල වෙනත් විශේෂ ගනුදෙනු

**01. හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ණය හා ඊට අදාල පොලිය**

ප්‍රාග්ධනයට අතිරේකව යම් හවුල්කරුවෙකු විසින් ව්‍යාපාරයට ණය මුදලක් සපයා ඇත්නම් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිගුකාලින වගකීමක් ලෙස පෙන්නුම් කළ යුතුය. මෙවැනි ණය සඳහා ගෙවිය යුතු පොලිය සටහන් කළ යුත්තේ මතු දැක්වෙන පරිදිය.

.................................................................................................................................................

.................................................................................................................................................

**02. ව්‍යාපාරය විසින් හවුල්කරුවන්ට සපයා ඇති ණය හෝ අත්තිකාරම් සහ ඊට අදාල පොලිය**

ව්‍යාපාරය විසින් යම් හවුල්කරුවෙකුට සපයා ඇති ණය හෝ අත්තිකාරම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කමක් ලෙස පෙන්නුම් කළ යුතුය. මෙවැනි ණය හෝ අත්තිකාරම් සඳහා අය විය යුතු පොලී සටහන් කළ යුත්තේ මතු දැක්වෙන පරිදිය.

.................................................................................................................................................

.................................................................................................................................................

**03. හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ගොඩනැගිල්ලක් හෝ වෙනත් වත්කමක් සඳහා කුලී**

හවුල්කරුවන්ගේ පෞද්ගලික වත්කමක් ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගනී නම් ඒ සඳහා එකඟ වූ කුලිය පහත සඳහන් පරිදි සටහන් කළ යුතුය.

..........................................................................................................................................

..........................................................................................................................................

**04. ව්‍යාපාරයේ කටයුතු වෙනුවෙන් හවුල්කරුවන් විසින් ඔවුන්ගේ පෞද්ගලික ධනයෙන් කර ඇති වැය කිරීම්**

ව්‍යාපාරයේ ගමන් බිමන් ආදිය සඳහා හෝ වෙනත් යම් ව්‍යාපාරික කටයුත්තක් සඳහා යම් හවුල්කරුවෙකු තම පෞද්ගලික ධනයෙන් වියදමක් දරා ඇත්නම් එය ව්‍යාපාරයෙන් අය කරගත හැකිය. මෙවැනි වියදම් සටහන් කළ යුත්තේ පහත සඳහන් පරිදිය.

..........................................................................................................................................

..........................................................................................................................................

## අභ්‍යාසය 115

ඉම්රාස්, බුද්ධික සහ මහී හවුල් ව්‍යාපාරයක යෙදී සිටිති. හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් විධිවිධාන සලසා තිබේ.

(1) ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය, ඉම්රාස්, බුද්ධික සහ මහී අතර පිළිවෙලින් 2 : 2 : 1 වේ.
(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය මත පොලී ගෙවීමක් සිදු නොකෙරේ.
(3) හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා වර්ෂයකට 5% බැගින් පොලී අයකරනු ලැබේ.
(4) බුද්ධික සහ මහී එක් අයෙකුට මසකට රු 2,000/- බැගින් වූ මාසික වැටුපකට හිමිකම් ලබයි.

හවුල් ව්‍යාපාරයේ පොත් වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම | | |
| ඉම්රාස් | | 2,000 |
| බුද්ධික | | 2,000 |
| මහී | | 1,000 |
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් | | |
| ඉම්රාස් | 50 | |
| බුද්ධික | 25 | |
| මහී | | 10 |
| හවුල්කරුවන්ගේ ගැනිලි : **ඉම්රාස්** (2014 ජුනි 01 දින) | 48 | |
| : **බුද්ධික** (2014 මැයි 01 දින) | 24 | |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. 695,000/- විය.
ඔබ විසින් කළ යුතු දෑ,
හවුල් ව්‍යාපාරයේ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා ලාභ විසර්ජන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - January 2016)**

## අභ්‍යාසය 116

අසංක, තිසංක සහ ඉසංක, ලාභා'ලාභ පිළිවෙලින් 4:4:2 අනුපාතය යටතේ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නිරතව සිටී.

හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ.

- ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත වර්ෂයකට 12% බැගින් පොලී ගෙවනු ලබයි.
- අසංක සහ තිසංක පිළිවෙලින් රු. 12,000/- සහ රු. 18,000/- බැගින් වූ මාසික වේවින ලැබීමට හිමිකම් ලබයි.

2019 මාර්තු 31 දිනට, හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී.

රු. '000

| | හර | බැර |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| **අසංක** | | 3,200 |
| **තිසංක** | | 2,100 |
| **ඉසංක** | | 900 |
| 2018 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් | | |
| **අසංක** | | 60 |
| **තිසංක** | 40 | |
| **ඉසංක** | | 30 |
| ගැනිලි | | |
| **අසංක** | 150 | |
| **තිසංක** | 200 | |
| **ඉසංක** | 150 | |

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 1,596,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ,

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - July 2019)**

## අභ්‍යාසය 117

කසුන්, දසුන් සහ සුපුන් ලාභ'ලාභ පිළිවෙලින් 4:3:3 අනුපාතයට බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක නිරත වේ. හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වෙව්

- ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වර්ෂයකට 10% පොලියක් ගෙවනු ලබයි.
- දසුන් වර්ෂයකට රු. 300,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගෙන ඇත.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් | | |
| **කසුන්** | | 4,000,000 |
| **දසුන්** | | 3,000,000 |
| **සුපුන්** | | 3,000,000 |
| ගැනිලි | | |
| **කසුන්** | 1,200,000 | |
| **දසුන්** | 600,000 | |
| **සුපුන්** | 300,000 | |

2018 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනයට පෙර ශුද්ධ ලාභය රු. 2,031,250/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - January 2019)**

## අභ්‍යාසය 118

ඇන්ඩි, රැන්ඩි සහ කැන්ඩි විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයේ, හවුල් ගිවිසුමෙහි පහත ප්‍රතිපාදනයන් කර තිබේ,

(1) හවුල් ව්‍යාපාරයේ ලාභ සහ අලාභ ඇන්ඩි, රැන්ඩි සහ කැන්ඩි අතර, පිළිවෙලින්, 3 : 2 : 1 යන අනුපාතයට බෙදාගත යුතුය.

(2) සියලුම හවුල්කරුවෝ වර්ෂය ආරම්භයේ පැවති ප්‍රාග්ධන ශේෂය මත ගණනය කළ වර්ෂයකට 10% බැගින් වූ ප්‍රාග්ධන පොලියක් ලැබීමට හිමිකම් ලබති.

(3) ඇන්ඩි ට සහ රැන්ඩි ට පිළිවෙලින් රු. 4,000/- ක් සහ රු. 6,000/- ක් බැගින් මාසික වැටුප් ගෙවනු ලැබේ.

(4) ගැනිලි සඳහා වර්ෂයකට 6% බැගින් පොලී අය කෙරේ.

2015 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

**ශේෂ පිරික්සුම**

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| **2014 මාර්තු 31 දිනට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම** | | |
| **ඇන්ඩි** | | 1,800 |
| **රැන්ඩි** | | 1,200 |
| **කැන්ඩි** | | 600 |
| 2014 අප්‍රේල් 01 දිනට, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම | | |
| **ඇන්ඩි** | | 30 |
| **රැන්ඩි** | 50 | |
| **කැන්ඩි** | | 70 |
| ගැනිලි: | | |
| **ඇන්ඩි** (2014 ජූලි 01 දින) | 50 | |
| **රැන්ඩි** (2014 ඔක්තෝම්බර් 01 දින) | 20 | |
| **කැන්ඩි** (2015 ජනවාරි 01 දින) | 30 | |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 594,000/- ක් විය.
**ඔබ විසින්,**
2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්, තීරු ක්‍රමයට පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - July 2015)**

## හවුල් ව්‍යාපාරයක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම - හවුල්කරුවන් අතර පවතින සම්බන්ධතා වල ස්වභාවයේ වෙනසක් නොමැති විට

**(සංයුතියේ වෙනසක් නොමැති විට)**

### අභ්‍යාසය 144

රොෂාන්ත, නිශාන්ත සහ ලසන්ත, "රොනිල් උපදේශකයෝ" නමින් ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන හවුල් ව්‍යාපාරයක නිරතව සිටී.

හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

(1) රොෂාන්ත, නිශාන්ත සහ ලසන්ත පිළිවෙලින් 5 : 2 : 3 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගනියි.

(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මත වාර්ෂිකව 5% බැගින් වූ ප්‍රාග්ධන පොලියකට හවුල්කරුවන් හිමිකම් ලබයි.

(3) ව්‍යාපාරය කළමනාකරණය කිරීම වෙනුවෙන් රොෂාන්ත, මාසිකව රු. 35,000/- බැගින් වූ වැටුපකට හිමිකම් ලබයි.

රොනිල් උපදේශකයෝහි ගිණුම් පොත්වලින් 2016 මාර්තු 31 දිනට පහත ශේෂ පිරික්සුම උපුටා ගෙන ඇත.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| විසර්ජනයට පෙර ශුද්ධ ලාභය | | 25,400 |
| 2015 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | | |
| රොෂාන්ත | | 10,500 |
| නිශාන්ත | | 6,000 |
| ලසන්ත | | 9,000 |
| 2015 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| රොෂාන්ත | 50 | |
| නිශාන්ත | 160 | |
| ලසන්ත | 330 | |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයටः | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල | 51,250 | |
| මෝටර් වාහනය | 2,500 | |
| 2016 මාර්තු 31 දිනට, සමුච්චිත ක්ෂයः | | |
| ගොඩනැගිල්ල | | 3,000 |
| මෝටර් වාහනය | | 1,250 |
| බැංකු ශේෂය | 242 | |
| තොගය | 656 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 3,610 | 4,288 |

| | | |
|---|---|---|
| නිශාන්තට දුන් ණය (01 වැනි සටහන) | 700 | |
| උපචිත වියදම් | | 60 |
| එකතුව | 59,498 | 59,498 |

01 වැනි සටහන

නිශාන්ත, රු. 700,000/- ක ණය මුදලක් 2015 සැප්තැම්බර් 30 දින, හවුල් ව්‍යාපාරයෙන් ලබා ගත්තේ ය. මෙම ණය මුදල මත 10% ක වාර්ෂික පොලියක් අයකිරීමට එකඟ විය. මෙම ණය මුදල මත පොලිය ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) 2016 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයටය, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 05)

(b) 2016 මාර්තු 31 දිනට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 05)

(මුළු ලකුණු 10)

**(AAT - January 2017)**

## අභ්‍යාසය 145

**රනිල්, අනුර** සහ **නාමල්** ලාභාලාභ පිළිවෙලින් 3 : 1 : 2 අනුපාතයට බෙදා ගනිමින් රන්මල් ට්‍රේඩර්ස් නම් වූ හවුල් ව්‍යාපාරයේ නිරතව සිටී.

හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් විධිවිධාන සලසා තිබේ.

- අනුර, රන්මල් ට්‍රේඩර්ස් හි කළමනාකරු ලෙස ක්‍රියා කරන අතර, ඔහුට වාර්ෂිකව රු. 50,000/- බැගින් වූ වැටුපක් ගෙවනු ලබයි.
- ප්‍රාග්ධන ගිණුම්වල වර්ෂය අවසානයේ පවතින ශේෂ මත 5% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුව ඇත.

2015 මාර්තු 31 දිනට රන්මල් ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පහත පරිදි විය.

**2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ, පිරිවැයට | | |
| ඉඩම | 1,300 | |
| ගොඩනැගිලි | 900 | |
| කාර්යාල උපකරණ | 300 | |
| 2014 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 45 |
| කාර්යාල උපකරණ | | 120 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 274 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 304 | |

| | | |
|---|---|---|
| 2014 අප්‍රේල් 01 දිනට, තොගය | 67 | |
| බැංකු ශේෂය | 30 | |
| මිලදී ගැනුම් / විකුණුම් | 367 | 580 |
| විකුණුම් ආපසු එවුම් | 15 | |
| පරිපාලන වියදම් | 115 | |
| බෙදාහැරීමේ වියදම් | 45 | |
| මූල්‍ය වියදම් | 11 | |
| 2014 අප්‍රේල් 01 දිනට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | | |
| රනිල් | | 1,200 |
| අනුර | | 400 |
| නාමල් | | 800 |
| 2014 අප්‍රේල් 01 දිනට, හවුල්කරුවන්ගේ ජංගම ගිණුම | | |
| රනිල් | | 45 |
| අනුර | | 35 |
| නාමල් | 45 | |
| එකතුව | 3,499 | 3,499 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) රු. 4,000/- ක ප්‍රමාණයක් බොල්ණය ලෙස ලියාහැරීමට ද ඉතිරි ණයගැතියනගේ ශේෂයෙන් 1% ක් අඩමාණ ණය ප්‍රතිපාදනයක් වශයෙන් සැලසීමට ද තීරණය කරන ලදී.

(2) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත පහත පරිදි ක්ෂය කළ යුතුය.
ගොඩනැගිලි : වාර්ෂිකව 2.5% බැගින්
කාර්යාල උපකරණ : වාර්ෂිකව 20% බැගින්

(3) 2015 මාර්තු 31 දිනට, තොගය පිරිවැය මත රු. 119,500/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රන්මල් ට්‍රේඩර්ස්** හි පහත දෑ පිළියෙල කරන්න.

(a) ආදායම් ප්‍රකාශය

(b) ලාභාලාභ විසර්ජන ගිණුම (ලකුණු 10)

**(AAT - January 2016)**

# අභ්‍යාසය 146

ලාභ සහ අලාභ පිළිවෙලින් 2 : 2 : 1 අනුපාතයට බෙදා ගැනීමට අමල්, නිමල් සහ කමල්, අන්කා නම් වූ හවුල් ව්‍යාපාරයක් පිහිටුවා ගත්හ. ඔවුන්ගේ හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත දෑ ප්‍රතිපාදනය කර තිබුණි.

- අමල්ට සහ කමල්ට පිළිවෙලින් රු. 3,000/- ක් සහ රු. 5,000/ ක් බැගින් වූ මාසික වැටුප් ගෙවිය යුතුය.

2015 මාර්තු 31 දිනට අන්කා හි ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ, පිරිවැයට | | |
| ඉඩම | 100 | |
| ගොඩනැගිලි | 200 | |
| බෙදාහැරීමේ වාහන | 400 | |
| 2014 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂයඃ | | |
| ගොඩනැගිලි | | 60 |
| බෙදාහැරීමේ වාහන | | 80 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 94 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 349 |
| බැංකුවේ ඇති මුදල් | 75 | |
| 2015 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 75 | |
| විකුණුම් පිරිවැය | 570 | |
| විකුණුම් | | 922 |
| පරිපාලන සහ ආයතන වියදම් | 50 | |
| විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් | 14 | |
| මූල්‍ය වියදම් | 10 | |
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | | |
| අමල් | | 120 |
| නිමල් | | 160 |
| කමල් | | 80 |
| 2014 අප්‍රේල් 01 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් | | |
| අමල් | | 5 |
| නිමල් | | 5 |
| කමල් | 7 | |
| හවුල්කරුවන්ගේ ගැනිලි : අමල් | 42 | |
| නිමල් | 24 | |

| | | |
|---|---|---|
| කමල් | 24 | |
| හවුල්කරුවන්ගේ වැටුප් | 96 | |
| එකතුව | 1,781 | 1,781 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2015 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 70,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(2) දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය මත ක්ෂය කළ යුතුය. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි : වර්ෂ 20
බෙදාහැරීමේ වාහන : වර්ෂ 5

(3) බොල්ණය ලෙස රු. 4,000/- ක ප්‍රමාණයක් කපා හැරිය යුතුය.

(4) 2015 මාර්තු 31 දිනට කලින් ගෙවීම් සහ උපචිත වියදම් පහත පරිදි විය.

| | උපචිත වියදම් (රු.) | කලින් ගෙවීම් (රු.) |
|---|---|---|
| වාහන රක්ෂණ වාරික | 5,000 | - |
| කාර්යාල වියදම් | - | 6,000 |

ඔබ විසින්, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න.**

(a) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අන්කා හි අදායම් ප්‍රකාශය

(b) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අන්කා හි ලාභාලාභ විසර්ජන ගිණුම.

(ලකුණු 10)

**(AAT - July 2015)**


සක්‍යා SAKYA

## කීර්තිනාමය

"පවත්නා ව්‍යාපාරයක් සමස්ථ ඒකකයක් ලෙස විකිණීමෙන් ලබාගත හැකි යැයි ඇස්තමේන්තු කළ වටිනාකමත් ව්‍යාපාරය සතු ශුද්ධ ස්පෘශ්‍ය වත්කම්වල වටිනාකමත් අතර වූ වෙනස" කීර්තිනාමය වේ.

කීර්තිනාමය අස්පෘශ්‍ය වත්කමකි. එහි භෞතික හෝ ද්‍රව්‍යාත්මක හෝ පැවැත්මක් නොමැත. එහෙත් කීර්තිනාමය ව්‍යාපාර ආයතනයකට වැඩි වැඩියෙන් ලාභ උපදවා දෙන මහඟු වත්කමකි. ව්‍යාපාර ආයතනයක් සමස්ථ ඒකකයක් ලෙස විකුණා දැමීමක දී කීර්තිනාමය සඳහා ද වටිනාකමක් ලබාගත හැකිය.

**කීර්තිනාමය ඇතිවීම කෙරෙහි බලපාන සාධක**

i) ගණුදෙනුකරුවන්ට පහසුවෙන් ලඟාවිය හැකි ස්ථානයක හා සුවපහසු ගොඩනැගිල්ලක ආයතනය පිහිටීම.

ii) ව්‍යාපාර ආයතනයේ සංවිධානාත්මක බව හා කාර්යක්‍ෂමභාවය.

iii) සපයනු ලබන භාණ්ඩයේ හෝ සේවාවේ ගුණාත්මකබව හා විශ්වාසදායීබව

iv) සිත් ඇදගන්නා සුළු ප්‍රචාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

v) තෘප්තිමත් සේවක පිරිසක් සිටීමෙන් ලැබෙන සුහද මිත්‍රශීලී සේවය.

## නව හවුල්කරුවෙකු බඳවා ගන්නා අවස්ථාවකදී කීර්තිනාමය ගැලපීම

හවුල් ව්‍යාපාරයකට නව හවුල්කරුවෙකු බඳවා ගන්නා අවස්ථාවකදී එම ව්‍යාපාරය සතු කීර්තිනාමය පැරණි හවුල්කරුවන්ට පමණක් හිමිවිය යුතු ය. නව හවුල්කරු එම කීර්තිනාමයට හිමිකම් ලබන්නේ නම් ඒ සඳහා ඔහු හෝ ඇය විසින් කිසියම් මුදලක් පැරණි හවුල්කරුවන්ට ලබාදිය යුතුය. නව හවුල්කරුවෙකු බඳවා ගන්නා අවස්ථාවකදී ව්‍යාපාරයේ හිමිකම්වල වෙනස්වීමක් සිදුවන බැවින් කීර්තිනාමය නොසලකා හැරීමෙන් සිදු වනුයේ හවුල්කරුවන්ගේ හිමිකම් හෙවත් වත්කම්වලට ඇති අයිතිය නිවැරදිව ගිණුම් පොත්වල නිරූපනය නොවීමකි.

නව හවුල්කරුවෙකු බඳවා ගන්නා අවස්ථාවකදී කීර්තිනාමය සටහන් කිරීම සඳහා යොදාගත හැකි විකල්ප ක්‍රම ගණනාවක් ඇත. ඒවා අතුරින් වඩා ප්‍රචලිත ක්‍රම කීපයක් පහත සඳහන් කර තිබේ.

## ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් නොපවතිනවිට කීර්තිනාමය ගැලපීම

(1) කීර්තිනාමයේ මුළු වටිනාකම කීර්තිනාම ගිණුමක සටහන් කිරීම.

..............................................................................................................................................

..............................................................................................................................................

(2) කීර්තිනාමයේ මුළු වටිනාකම කීර්තිනාම ගිණුමක සටහන් කර පසුව කපාහැරීම.

(i) සටහන් කිරීම

..............................................................................................................................................

..............................................................................................................................................

(ii) කපාහැරීම

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(3) කීර්තිනාම ගිණුමක් විවෘත නොකර කීර්තිනාමය මුළු වටිනාකම ප්‍රාග්ධන ගිණුම්වලින් ගැලපීම

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

සටහන - ඉහත සඳහන් ක්‍රම භාවිතා කරන අවස්ථාවකදී නව හවුල්කරු කීර්තිනාමය සඳහා යම් මුදලක් ව්‍යාපාරයට රැගෙන එන්නේ නම් එම මුදල ඔහුගේ ප්‍රාග්ධන ගිණුමට බැර කළ යුතු ය.

(4) කීර්තිනාම ගිණුමක් විවෘත නොකර නව හවුල්කරු කීර්තිනාමය සඳහා රැගෙන එනු ලබන මුදල් සටහන් කිරීම.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

සටහන - නව හවුල්කරු ඇතුලු වීමත් සමග පැරණි හවුල්කරුවන්ගේ ලාභ බෙදාගත් සම්බන්ධතාව වෙනස් නොවන්නේ නම් පැරණි අනුපාතයද එම සම්බන්ධතාව වෙනස් වන්නේ නම් ලාභ කැපකළ අනුපාතයද යොදා ගත යුතු ය.

සටහන - (ii) නව හවුල්කරු රැගෙන ආ මුදල් පැරණි හවුල්කරුවන් විසින් ඉවත් කර ගනී නම් පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් එම සටහන් කළ අනුපාතයට හර කර මුදල් පොත බැර කළ යුතු ය.

## අභ්‍යාසය 119

අමිත් සහ දමිත් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අතර, ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතය යටතේ බෙදාගනු ලබයි. ඔවුන් විසින් රමිත නම් නව හවුල්කරුවෙකු බඳවාගත් අතර, අමිත්, දමිත් සහ රමිත් අතර ලාභා'ලාභ පිළිවෙලින් 3:3:4 අනුපාතයට බෙදාගැනීමට තීරණය කරන ලදී.

අමිත් සහ දමිත් අතර කැපකල අනුපාතය (sacrifying ratio) ගණනය කරන්න.

**(AAT - July 2019)**

## අභ්‍යාසය 120

ලාභ අලාභ 3:2 අනුපාතයට බෙදාගන්නා අරවින්ද සහ හෂාන් හවුල්කරුවෝ වෙති. ඔවුන් රොෂාන්ව නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී.

පහත එකිනෙක ස්වාධීන අවස්ථා යටතේ හවුල්කරුවන් අතර නව ලාභ බෙදා ගැනීමේ අනුපාතය සහ කැප කළ අනුපාතය ගණනය කරන්න.

(a) රොෂාන්ගේ ලාභ කොටස 1/3 ක් නම්,

(b) රොෂාන්ගේ ලාභ කොටස 4/10 ක් නම් සහ එයින් 3/10 ක් අරවින්දගෙන් සහ 1/10 ක් හෂාන්ගෙන් අත්පත් කර ගත්තේ නම්,

**සටහන්**

නව හවුල්කරු ඔහුගේ ලාභ කොටස දැනට සිටින හවුල්කරුවන්ගෙන් පැරණි අනුපාතයට අත්පත් කර ගන්නේ නම්, කැප කළ අනුපාතය ඔවුන් අතර පැවති පැරණි ලාභ බෙදාගැනීමේ අනුපාතයටම සමාන වේ. (ගැටළුවේ පළමු අවස්ථාව) කැප කළ අනුපාතය ඔවුන් අතර පවතින ලාභ අනුපාතය හැර එකඟ වූ වෙනත් අනුපාතයක් නම්, ගණනය කළ කැප කළ අනුපාතය ඔවුන් එකඟ වූ අනුපාතයම වේ.

ඉහත ගැටළුව නව හවුල්කරුවෙකු ඇතුළත් වීමේදී නව ලාභාලාභ අනුපාතය ගණනය කිරීම හා බැඳී පවතී. එසේම, දැනට සිටින හවුල්කරුවෙකුගේ මිය යාමකදී හෝ විශ්‍රාම යාමකදී ඔහුගේ ලාභ කොටස දැනට සිටින හවුල්කරුවන් අත්පත් කර ගනී. මෙය දැනට සිටින හවුල්කරුවන් අතර භුක්ති විඳීමේ අනුපාතයක් ඇති කිරීමට හේතු වේ.

## අභ්‍යාසය 121

ලාභ සහ අලාභ 2 : 3 අනුපාතයට බෙදාගනිමින් බීන් සහ ඩීන් හවුල් ව්‍යාපාරයක යෙදී සිටියහ. හැකියාවන් සහිත ව්‍යාපාරිකයෙකු වන රීන් ලාභ සහ අලාභ වලින් 50% ක් බෙදා ගැනීම සඳහා අලුත් හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලද අතර, පවත්නා හවුල් ව්‍යාපාරයේ වටිනාකමින් ඔහුගේ කොටසට ගැලපෙන ආකාරයෙන් අවශ්‍යකරන ප්‍රාග්ධන කොටස ආයෝජනය කිරීමට එකඟ වී ඇත.

පවත්නා හවුල් ව්‍යාපාරයේ වටිනාකම පහත සඳහන් පරිදි වේ,

| | බීන් (රු) | ඩීන් (රු) |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (බැර) | 500,000 | 75,000 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (බැර) | 212,000 | 318,000 |

පොත්වල ගිණුම්ගත කර නොතිබූ කීර්තිනාමය රු. 500,000/- ක් ලෙසට ඇගයීම් කර තිබේ.

ඔබ විසින්,

(a) රීන් බඳවා ගැනීමෙන් පසු නව ලාභ සහ අලාභ බෙදා ගැනීමේ අනුපාතය **හඳුනා දක්වන්න.**

(b) දැනට සිටින හවුල්කරුවන්ගේ පරිත්‍යාග කරන අනුපාතය (Sacrificing Ratio) **ගණනය කරන්න.**

(c) කීර්තිනාමය ගිණුම් පොත් වල පෙන්වීමට හවුල්කරුවන් එකඟවන්නේ නම් රීන් විසින් කළ යුතු මුළු ආයෝජනයේ වටිනාකම, කීර්තිනාමයේ කොටස ද ඇතුළුව, **ගණනය කරන්න.**

(ලකුණු 05)

**(AAT - July 2015)**

## හවුල්කරුවෙකු ඉවත් යන අවස්ථාවදී කීර්තිනාමය ගැලපීම

හවුල්කරුවෙකු මියයාම හෝ විශ්‍රාම ගැනීමෙන් ව්‍යාපාරයෙන් ඉවත්ව යන අවස්ථාවකදී හවුල් ව්‍යාපාරය සතු කීර්තිනාමයෙන් කොටසක් ඉවත්ව යන හවුල්කරුගේ බූදලයට අයත් විය යුතු ය. මෙවැනි අවස්ථාවකදී කීර්තිනාමය සැලකිල්ලට නොගතහොත් ඉවත්ව යන හවුල්කරුට හිමිවිය යුතු කීර්තිනාමයේ කොටසක් තව දුරටත් ඉතිරිවන හවුල්කරුවන්ට භුක්ති විඳීමට ඉඩකඩ ලැබීමෙන් ඉවත්ව යන හවුල්කරුට හෝ ඔහුගේ උරුමක්කරුවන්ට අසාධාරණයක් ඇති වේ. හවුල්කරුවෙකු ඉවත්ව යන අවස්ථාවකදී කීර්තිනාමය ගැලපිය යුතු වන්නේ එම කරුණු පදනම් කරගෙනය.

හවුල්කරුවෙකු ඉවත්ව යන අවස්ථාවකදී කීර්තිනාමය සටහන් කිරීම සඳහා යොදාගත හැකි විකල්ප ක්‍රම ගණනාවක් ඇත. ඒවා අතුරින් වඩා ප්‍රචලිත ක්‍රම කීපයක් පහත සඳහන් කර තිබේ.

**ව්‍යාපාරයේ පොත්වල දැනට කීර්තිනාම ගිණුමක් නොපවතින විට කීර්තිනාමය ගැලපීම**

**(1) කීර්තිනාමයේ මුළු වටිනාකම කීර්තිනාම ගිණුමක සටහන් කිරීම.**

කීර්තිනාම ගිණුම හර
ඉවත්ව යන හවුල්කරු ඇතුලුව සියලුම
පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම බැර (පැරණි අනුපාතය අනුව)

**(2) කීර්තිනාමයෙන් ඉවත්ව යන හවුල්කරුගේ කොටස පමණක් කීර්තිනාම ගිණුමක සටහන් කිරීම.**

..........................................................................................................

..........................................................................................................

**(3) කීර්තිනාමයේ මුළු වටිනාකම කීර්තිනාම ගිණුමක සටහන් කර පසුව ලියාහැරීම**

**(i) සටහන් කිරීම**

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

**(ii) කපා හැරීම**

..........................................................................................................

..........................................................................................................

**(4) කීර්තිනාමයෙන් ඉවත්ව යන හවුල්කරුගේ කොටස පමණක් සටහන් කර පසුව කපාහැරීම**

**(i) සටහන් කිරීම**

..........................................................................................................

..........................................................................................................

**(ii) කපා හැරීම**

..........................................................................................................

..........................................................................................................

සටහන - හවුල්කරු ඉවත්වගිය පසු ඉතිරිවන හවුල්කරුවන් ලාභ බෙදාගත් සම්බන්ධතාවය වෙනස් නොවන්නේ නම් අලුත් අනුපාතයටද එම සම්බන්ධතාවය වෙනස් වන්නේ නම් ලාභ භුක්ති විඳින අනුපාතයද යොදා ගත යුතුය.

**5) කීර්තිනාම ගිණුමක් විවෘත නොකර කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වලින් ගැලපීම**

| | |
|---|---|
| ඉතිරිවන හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම | හර (අලුත් අනුපාතය අනුව) |
| ඉවත්ව යන හවුල්කරු ඇතුලුව සියලුම පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | බැර (පැරණි අනුපාතය අනුව) |

## හවුල්කරුවෙකු ඉවත්ව යාම

හවුල්කරුවෙකුගේ මරණය හෝ විශ්‍රාම ගැනීම මත හවුල් ව්‍යාපාරයකින් ඉවත්ව යන අවස්ථාවකදී ඔහුට ව්‍යාපාරයෙන් හිමි මුදලය ගණනය කොට ගෙවා දැමිය යුතුය. නැතහොත් එම මුදලය පසුව ගෙවීම පිණිස ඔහු නමින් ණය ගිණුමකට මාරු කළ යුතු ය.

ඉවත්ව යන හවුල්කරුවෙකුගේ මුදලයට පහත සඳහන් දෑ අයත් වේ.

(1) හවුල්කරුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

(2) හවුල්කරුගේ ජංගම ගිණුමේ ශේෂය (හවුල්කරු ඉවත් වූ වර්ෂයේ ලාභාලාභවලින් ඔහුට අයත් කොටසද ඇතුලුව)

(3) හවුල්කරුට කීර්තිනාමයෙන් හිමි කොටස

(4) හවුල්කරුට ප්‍රත්‍යාගණන ලාභ-අලාභවලින් හිමි කොටස

(5) පොදු සංචිත වැනි නොබෙදූ ලාභවලින් හවුල්කරුට හිමි කොටස

## අභ්‍යාසය 122

ලාභාලාභ 3 : 2 : 1 අනුපාතයට බෙදා ගන්නා කුමාර, මහේල සහ රුචිර හවුල්කරුවෝ වෙති.

පහත එකිනෙක ස්වාධීන අවස්ථා යටතේ හවුල්කරුවන් අතර නව ලාභ බෙදාගැනීමේ අනුපාතය සහ භුක්ති විඳීමේ අනුපාතය ගණනය කරන්න.

I කුමාර විශ්‍රාම ගත්තේ නම්,

II මහේල මිය ගියේ නම් සහ ඔහුගේ ලාභ කොටස කුමාර සහ රුචිය 5 : 3 අනුපාතයට ලබා ගත්තේ නම්,

## අභ්‍යාසය 123

ලාභ සහ අලාභ 5:3:2 අනුපාතයට බෙදාගන්නා අමාලි, බිමාලි සහ චමිලි හවුල්කරුවෝ වෙති. ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 100,000 කට අගය කරන ලදී. ඔවුන් ලාභ බෙදා ගැනීමේ අනුපාතය 2:2:1 ලෙස වෙනස් කිරීමට තීරණය කරන ලදී. පහත අවස්ථා යටතේ ජ නල් සටහන් දක්වන්න.

අ) පොත්වල කීර්තිනාමය පවත්වාගෙන යන විට,

ආ) කීර්තිනාමය පොත්වල ඇති කරන නමුත් එය ක්ෂණිකව පොත් වලින් ලියා හරින විට,

ඇ) පොත්වල කීර්තිනාමය පවත්වා නොගෙන කීර්තිනාමයෙහි බලපෑම සෘජුවම ප්‍රාග්ධන ගිණුම්වල ගළපන විට,

## අභ්‍යාසය 124

ලාභ සහ අලාභ 3 : 2 අනුපාතයට බෙදා ගන්නා අශේන් සහ භානුක හවුල්කරුවෝ වෙති. ඔවුන් චාරුනීව නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීමට තීරණය කළ අතර ව්‍යාපාරයේ කීර්තිනාමය රු.240,000 කට අගය කරන ලදී. නව ලාභ සහ අලාභ අනුපාතය 5:3:2 ලෙස වෙනස් විය.

පහත අවස්ථා යටතේ ජර්නල් සටහන් දක්වන්න.

අ) පොත්වල කීර්තිනාමය පවත්වාගෙන යන විට

ආ) කීර්තිනාමය පොත්වල ඇති කරන නමුත් එය ක්ෂණිකව පොත් වලින් ලියා හරින විට

ඇ) කීර්තිනාමයෙහි බලපෑම සෘජුවම හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් වල ගලපන විට

ඈ) චාරුනී ඇයගේ කීර්තිනාම කොටස වෙනුවෙන් මුදල් රැගෙන එන විට

ඉ) චාරුනී ඇයගේ කීර්තිනාම කොටස ඇය පැමිණීමෙන් වසර දෙකකට පසු ගෙවීමට පොරොන්දු වන විට

## අභ්‍යාසය 125

අමල්, බිමල් සහ චමල් ලාභා'ලාභ පිළිවෙලින් 3:5:2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නියැලී සිටියහ. බිමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, අමල් සහ චමල් ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාමට එකඟ වූහ.

නව හවුල් ව්‍යාපාරයේ අමල්ගේ සහ චමල්ගේ භුක්ති විඳීමේ අනුපාතය ගණනය කරන්න.

*(ලකුණු 02)*

**(AAT - July 2018)**

## අභ්‍යාසය 126

ලාභ සහ අලාභ 4:3:2 අනුපාතයට බෙදාගන්නා විපුල, කවිඳු සහ ප්‍රභාත් හවුල්කරුවෝ වෙති. ප්‍රභාත් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගිය අතර ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 900,000 කට අගය කරන ලදී. නව ලාභ සහ අලාභ අනුපාතය 5:3 ලෙස වෙනස් විය.

පහත අවස්ථා යටතේ ජ'නල් සටහන් දක්වන්න.

අ) පොත්වල කීර්තිනාමය පවත්වාගෙන යනවිට

ආ) කීරතිනාමය පොත්වල ඇති කරන නමුත් එය ක්ෂණිකව පොත් වලින් ලියා හරින විට

ඇ) කීර්තිනාමයෙහි බලපෑම සෘජුවම හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් වල ගළපන විට

ඈ) ප්‍රභාත්ගේ කීර්තිනාම කොටස පොත්වල වාර්තා කරන විට

ඉ) ප්‍රභාත්ගේ කීර්තිනාම කොටස පොත්වල වාර්තා කර එය ක්ෂණිකව පොත්වලින් ලියා හරිනවිට

### ලාභලාභ අනුපාතය වෙනස්වන අවස්ථාවක දී කීර්තිනාමය ගැලපීම

## අභ්‍යාසය 127

ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට, බෙදාගනිමින් අමින්ද සහ දුමින්ද යන දෙදෙනා වසර ගණනාවක සිට හවුල් ව්‍යාපාරයක නිරතව සිටී. 2016 අප්‍රේල් 01 දින අමින්ද, හවුල් ව්‍යාපාරයේ ගත කරනු ලබන කාලය සීමා කිරීමට තීරණය කළ අතර, ඒ අනුව, ලාභා'ලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින්, 1:3 ලෙස වෙනස් කිරීමට එකග විය.

2016 අප්‍රේල් 01 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 2,400,000/- ක් ලෙසට අගය කරන ලද අතර, ගිණුම් පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ,

හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ වටිනාකම වාර්තා කිරීම සහ ලියා හැරීම වාර්තා කිරීම සඳහා (to record and eliminate) ජර්නල් සටහන් පිළියෙල කරන්න. **(ලකුණු 05)**

**(AAT - July 2016)**



922
120
160
80
5
5
1,781

ලෙස ඇස්තමේන්තු කර

මත ක්ෂය කළ යුතුය.
වේ.

විය.

## හවුල් ව්‍යාපාරයක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම - හවුල්කරුවන් අතර පවතින සම්බන්ධතා වල ස්වභාවයේ වෙනසක් ඇති විට
**(සංයුතියේ වෙනසක් පවතින විට)**

දැනට පවත්නා ව්‍යාපාරයට බලපාන නව ගිවිසුමක් හරහා හවුල්කරුවන් අතර පවතින සම්බන්ධතාවල ස්වභාවයේ වෙනසක් ඇති වීම හවුල් ව්‍යාපාර සංයුතියේ වෙනසක් වීම ලෙස හැඳින්විය හැකි ය.

### සංයුතිය වෙනස් විය හැකි ආකාර

සාමාන්‍යයෙන් හවුල් ව්‍යාපාරයක සංයුතිය පහත ආකාරවලට වෙනස්විය හැකි ය.

1. ..................................................................................................................................................
2. ..................................................................................................................................................
3. ..................................................................................................................................................
4. ..................................................................................................................................................
5. ..................................................................................................................................................

සංයුතියේ වෙනසක් වන අවස්ථාවල දී පොත්වල පහත සඳහන් නිශ්චිත ගැලපිලි සිදු කිරීම අවශ්‍ය වේ.

1. ලාභ සහ අලාභ අනුපාතය සම්බන්ධයෙන් ගැලපිලි
2. කීර්තිනාමය සම්බන්ධයෙන් ගැලපිලි
3. වත්කම් ප්‍රත්‍යාගණනය සහ වගකීම් නැවත තක්සේරුව සම්බන්ධයෙන් ගැලපිලි

### අභ්‍යාසය 105

01. හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇගයීම් කර ගිණුම් පොත්වල ගැලපීම් කළ යුතු අවස්ථා දෙකක් (02) සඳහන් කරන්න. **(ලකුණු 02)**

**(AAT - July 2016)**

02. පවත්නා හවුල් ව්‍යාපාරයක් අවසන් වූවා (ended) සේ සැලකීමටත් නැවත පිහිටුවීමක් (reconstitution) අවශ්‍ය වීමටත් තුඩු දෙන අවස්ථා තුනක් (03) සඳහන් කරන්න. **(ලකුණු 03)**

**(AAT - July 2015)**

## අභ්‍යාසය 106

(A) හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය අගය කිරීමට අවශ්‍ය කෙරෙන අවස්ථා හතරක් (04) ලැයිස්තුගත කරන්න. **(ලකුණු 02)**

(B) **හිරු** හා **සඳු** ලාභ හා අලාභ පිළිවෙලින් 3 : 2 අනුපාතයට බෙදා ගන්නා **විෂුවල් පාට්නස්හි** හවුල්කරුවෝ වෙති.

2010 අප්‍රේල් 01 දින සිට හවුල් ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු වන **තරු**, පහත සඳහන් කොන්දේසි මත නව හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලදි.

(1) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ මුළු වටිනාකම රු. 18,000,000/- කට අගය කරන ලද අතර කීර්තිනාමය ගිණුම් පොත්වල නොපෙන්වා අවශ්‍ය ගැලපීම් ප්‍රාග්ධන ගිණුම් මාර්ග යෙන් ගිණුම්ගත කිරීමට ඔවුහු එකඟ වූහ.

(2) තරු විසින් ඔහුගේ ප්‍රාග්ධනය සහ කීර්තිනාමයේ කොටස වශයෙන් රු. 11,000,000/- ක් හවුල් ව්‍යාපාරයට ගෙන ආ යුතු විය.

(3) නව හවුල් ගිවිසුම අනුව හවුල්කරුවන්ට පහත සඳහන් පරිදි මාසික වැටුප්වලට හිමිකම ඇත.

| | | |
|---|---|---|
| **හිරු** | - | රු. 50,000/- |
| **සඳු** | - | රු. 40,000/- |
| **තරු** | - | රු. 30,000/- |

(4) **හිරු**, **සඳු** හා **තරු** යන හවුල්කරුවන් අතර ලාභ සහ අලාභ පිළිවෙලින් 3 : 2 : 1 අනුපාතයට බෙදා ගත යුතුය.

2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි විය.

| | හර රු. 000 | බැර රු. 000 |
|---|---|---|
| 2010 අප්‍රේල් 01 දිනට තොග | 2,550 | |
| ගැනුම් | 19,280 | |
| විකුණුම් | | 50,000 |
| හවුල්කරුවන්ගේ වැටුප් ඇතුළුව පරිපාලන වියදම් | 14,628 | |
| වෙළෙඳ ප්‍රදර්ශනාගාර කුලිය | 1,980 | |
| විකුණුම් වියදම් | 2,425 | |
| අයිරා පොලිය | 600 | |
| ආයෝජන ආදායම් | | 240 |
| **ප්‍රාග්ධන ගිණුම්:** | | |
| **හිරු** | | 18,000 |
| **සඳු** | | 14,800 |
| **තරු** | | 11,000 |

| | | |
|---|---|---|
| **ජංගම ගිණුම්:** | | |
| **හිරු** | | 5 |
| **සඳු** | | 400 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,560 | 3,650 |
| බැංකු අයිරාව | | 2,611 |
| **දේපළ පිරියත හා උපකරණ පිරිවැයට:** | | |
| ඉඩම් ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය රු. මිලියන 25) | 35,000 | |
| කාර්යාල උපකරණ | 10,000 | |
| මෝටර් වාහන | 10,800 | |
| **සමුච්චිත ක්ෂය වීම** (2010 අප්‍රේල් 01 දිනට) | | |
| ගොඩනැගිලි | | 1,600 |
| කාර්යාල උපකරණ | | 2,400 |
| මෝටර් වාහන | | 3,400 |
| ආයෝජන | 2,420 | |
| 2010 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය | | 363 |
| අතැති හා බැංකුවේ මුදල් | 226 | |
| | **108,469** | **108,469** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) දේපල, පිරියත හා උපකරණ ක්ෂයවීම් සඳහා සරල මාර්ග ක්‍රමය මත පිරිවැයට පහත සඳහන් පරිදි ප්‍රතිපාදනය කළ යුතුය.

| | |
|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | 5% බැගින් |
| කාර්යාල උපකරණ වර්ෂයකට | 10% බැගින් |
| මෝටර් වාහන වර්ෂයකට | 25% බැගින් |

(2) වෙළෙඳ ප්‍රදර්ශනාගාරය සඳහා මාසික කුලිය රු. 180,000/- ක් වන අතර ගෙවල් කුලී ගිවිසුම 2008 ජනවාරි 01 වන දින ආරම්භ වන අතර වර්ෂ 5 ක කාල පරිච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක වේ.

(3) 2011 මාර්තු 31 දිනට ලැබිය යුතු රු. 460,000/- ක මුදලක් බොල්ණය ලෙස ලියා හැරිය යුතු අතර ඉතිරි ශේෂයෙන් 5% ක් වන සේ අඩමාණ ණය ප්‍රතිපාදනයක් කළ යුතුය.

(4) 2011 මාර්තු 31 දිනට තොගය රු. 3,830,000/- කි.

(5) හවුල්කරුවන්ගේ වැටුප් සෑම මාසයකම වැඩ කරන අවසාන දිනයේ දී මුදලින් ගෙවා ඇත.

**ඔබ විසින්, විෂුවල් පාට්නර්ස්** සඳහා පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ, ලාභාලාභ ගිණුම සහ විසර්ජන ගිණුම

(b) 2011 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(c) තීරු ක්‍රමයට 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම් **(AAT - January 2012)**

## අභ්‍යාසය 107

(A) 1890 හවුල් ව්‍යාපාර පනතේ 24 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදන (provisiona) දෙකක් (02) සඳහන් කරන්න. **(ලකුණු 02)**

(B) සුනිල් සහ නිමල්, ඩ්‍රීම් වර්ල්ඩ් නමැති වෘත්තිය වාස්තු විද්‍යාඥ හවුල් ව්‍යාපාර ආයතනයක ලාභ හා අලාභ සමසේ බෙදා ගන්නා හවුල්කරුවන් දෙදෙනෙකි.

හවුල් ව්‍යාපාරයේ මෙහෙයුම් කළමනාකරු ලෙස නිරතව සිටි අමල් 2012 අප්‍රේල් 01 සිට

**වත්කම් ප්‍රත්‍යාගණනය සහ වගකීම් නැවත තක්සේරුව සම්බන්ධයෙන් ගැලපිලි**

හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස් වන අවස්ථාවක දී ව්‍යාපාරයේ වත්කම් ඒවායේ වර්තමාන අගයන්ට පොත්වල පෙන්නුම් කරන්නේ ද යන්න නිශ්චය කර ගැනිම සැමවිට ම වැදත් වන අතර වෙනසක් ඇත්නම් මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කළ හැකි ය. එසේම, වගකීම් නැවත තක්සේරුව ද සිදු කළ හැකි ය.

වත්කම් ප්‍රත්‍යගණනය සහ වගකීම් නැවත තක්සේරුව වාර්තා කිරිම සඳහා ජර්නල් සටහන් පහත පරිදි දැක්විය හැකි ය.

1. වත්කමක අගය වැඩි වීම සඳහා

   ..........................................................................................................................................

   ..........................................................................................................................................

2. වත්කමක අගය අඩු වීම සඳහා

   ..........................................................................................................................................

   ..........................................................................................................................................

3. වගකීමක අගය වැඩි වීම සඳහා

   ..........................................................................................................................................

   ..........................................................................................................................................

4. වගකීමක අගය අඩු වීම සඳහා

   ..........................................................................................................................................

   ..........................................................................................................................................

5. ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරිම සඳහා

| | | |
|---|---|---|
| ප්‍රත්‍යාගණන ගිණුම | හර | |
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම (පැරණි අනුපාතය) | | බැර |

6. ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම සඳහා

| | | |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (පැරණි අනුපාතය) | හර | |
| ප්‍රත්‍යාගණන ගිණුම | | බැර |

## අභ්‍යාසය 128

රන්මල් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ A, B සහ C පිළිවෙලින් 4 : 3 : 3 අනුපාතයට ලාභා'ලාභ බෙදාගෙන තිබුණි. 2017 අප්‍රේල් 01 දින, ඊ හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රම ගැනීමට තීරණය කළ අතර, A සහ C ලාභා'ලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වූහ.

2017 අප්‍රේල් 01 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 930,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

2017 අප්‍රේල් 01 දින මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කළ අතර, හවුල් ව්‍යාපාරයේ මෝටර් වාහනවල විස්තර පහත දැක්වේ.

| | පිරිවැය | 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | 2017 අප්‍රේල් 01 දිනට ප්‍රත්‍යාගණන අගය |
|---|---|---|---|
| මෝටර් වාහන | 1,800,000 | 900,000 | 1,200,000 |

මෝටර් වාහන ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණිත අගයට දක්වනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත කීර්තිනාමය සහ ප්‍රත්‍යාගණනය වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන් පිළියෙල කරන්න.

(ලකුණු 05)

**(AAT - January 2018)**

## අභ්‍යාසය 129

පෙරේරා, සිල්වා සහ අයිවන් ලාභා'ලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතය බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක යෙදී සිටියහ. 2017 මාර්තු 31 දින අයිවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, පෙරේරා, සහ සිල්වා ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගැනීමට එකඟ වූහ. 2017 මාර්තු 31 දින අයිවන් විශ්‍රාම ගැනීමත් සමග, ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කළ අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| | පිරිවැය (රු.'000) | 2017 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය (රු. '000) | 2017 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණන අගය (රු. '000) |
|---|---|---|---|
| ඉඩම | 1,000 | - | 1,500 |
| ගොඩනැගිලි | 2,000 | 600 | 1,800 |
| යන්ත්‍රෝපකරණ | 800 | 500 | 600 |
| කාර්යාල උපකරණ | 700 | 200 | 500 |

ගිණුම් පොත්වල ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණන අගයට දක්වනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ප්‍රත්‍යාගණනය සටහන් කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - July 2017)**

## අභ්‍යාසය 130

ගංගා, නදී සහ යමුනා 2005 දී පිහිටුවන ලද හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ය. හවුල් ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ:

- ගංගා, නදී සහ යමුනා පිළිවෙලින් 3:2:1 අනුපාතයට ලාභ'ලාභ බෙදා ගනී.
- ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
- ගංගා සහ නදීට පිළිවෙලින් රු.10,000/- ක් සහ රු.15,000 ක මාසික වැටුපකට හිමිකමක් ඇත.

පහත සඳහන් ශේෂ පිරික්සුම 2019 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | හර | බැර |
|---|---|---|
| දේපල, පිරියත සහ උපකරණ | 3,700 | |
| සමුච්චිත ක්ෂය | | 420 |
| විකුණුම් පිරිවැය | 2,985 | |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් | | |
| ගංගා | | 1,500 |
| නදී | | 1,000 |

| | | |
|---|---|---|
| යමුනා | | 500 |
| 2018 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් ශේෂයන | | |
| ගංගා | | 300 |
| නදී | 100 | |
| යමුනා | | 285 |
| විකුණුම් | | 6,800 |
| පරිපාලන වියදම් | 470 | |
| බෙදාහැරීමේ වියදම් | 1,800 | |
| මූල්‍ය වියදම් | 225 | |
| ගැනිලි ගංගා | 120 | |
| නදී | 125 | |
| යමුනා | 60 | |
| අතැති සහ බැංකු මුදල් | 1,220 | |
| | **10,805** | **10,805** |

2019 මාර්තු 31 දින හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම යාමට යමුනා තීරණය කරන ලදී. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,800,000/- ක් ලෙස ගණනය කරන ලද අතර එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමට තීරණය විය.

ලාභ'ලාභ සමසමව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමට ගංගා සහ නදී තීරණය කරන ලදී. යමුනාගේ විශ්‍රාම ගැනිමෙන් පසු ඇයට ගෙවියයුතු මුදල ණය ගිණුමකට මාරු කිරිමට තීරණය කළේය.

**ඔබ විසින් කළයුතු දෑ:**

**2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ පිළියෙල කරන්න:**

(a) හවුල් ව්‍යාපාරය අදාල ලාභ'ලාභ විසර්ජන ගිණුම

(b) ප්‍රාග්ධන ගිණුම්

(c) ජංගම ගිණුම් **(PILOT paper 2020)**

## අභ්‍යාසය 131

රංජිත, සුනිල් සහ තිලක් යනු ලාභාලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතය යටතේ බෙදාගනු ලබන හවුල්ව්‍යාපාරයක හවුල්කරුවන්ය, එක් අයෙකුට රු. 20,000/- බැගින් වූ මාසික වැටුපකට රංජිත් සහ සුනිල් හිමිකම් කියයි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 1,600,00/- කි.

(2) 2020 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ පොත්වල පහත සඳහන් ශේෂයන් පැවතුණි.

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| 2019 අපෝල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| රංජිත් | | 2,250,000 |
| සුනිල් | | 1,350,000 |
| තිලක් | | 900,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම | | |
| රංජිත් | | 95,000 |
| සුනිල් | 500,000 | |
| තිලක් | 200,000 | |
| ගැනිලි | | |
| රංජිත් | 780,000 | |
| සුනිල් | 260,000 | |
| තිලක් | 60,000 | |

(3) තිලක්, 2020 මාර්තු 31 දිනට හවුල් වයාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලද අතර, තිලක් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව රංජිත් සහ සුනිල් විසින් ලාභාලාභ පිළිවෙලින් 5:3 අනුපාතය යටතේ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමට තීරණය කරන ලදී.

(4) 2020 මාර්තු 31 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,200,000/- කට අගය කරන ලදී. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

(5) විශ්‍රාම ගැනීම නිසා තිලක්ට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

ඔබ විසින් කළ යුතු දෑ,

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ලාභාලාභ විසර්ජන ගිණුම

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

(c) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

## අභ්‍යාසය 132

සඳුනි, කසුනි සහ නදුනි, මුන් ට්‍රේඩින් නම් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ අතර, ලාභාලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදාගනු ලැබේ.

පහත සඳහන් තොරතුරු සපයා ඇත.

01. හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුළත් වෙවි

- හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත වාර්ෂිකව 12% බැගින් වූ පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකම් ඇත.
- රු. 60,000/- බැගින් වූ මාසික වැටුපක් ලැබිමට කසුනිට හිමිකම ඇත.

02. 2019 දෙසැම්බර් 31 දිනට මුන් ට්‍රේඩින් හි ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදි.

| | හර (රු.000) | බැර (රු.000) |
|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම් | | |
| සඳුනි | | 7,500 |
| කසුනි | | 9,000 |
| නදුනි | | 10,000 |
| 2019 ජනවාරි 01 දිනට ජංගම ගිණුම් | | |
| සඳුනි | | 3,000 |
| කසුනි | 1,200 | |
| නඳුනි | | 1,500 |

03. 2019 දෙසැම්බර් 31 දින, නදුනි තම පෞද්ගලික හේතු මත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර ඇත. නදුනිගේ විශ්‍රාම යෑමෙන් පසු. සදුනි සහ කසුනි හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගැනීමට තීරණය විය.

04. 2019 දෙසැම්බර් 31 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,500,000/- කට අගය කළ අතර, එය කීර්තිනාම ගිණුමක් භාවිත නොකොට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීම් කළ යුතු වේ.

05. 2019 දෙසැමබ්ර් 31 දිනට, ජංගම නොවන වත්කම් පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

| | 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කළ අගය (රු.'000) | 2019 දෙසැම්ර් 31 දිනට පිරිවැය (රු. '000) | 2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 5,400 | 7,500 | 4,200 |
| මෝටර් වාහන | 900 | 2,250 | 750 |

ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණන අගයට හවුල් ව්‍යාපාරයේ පොත්වල පවත්වාගෙන යනු ලැබේ.

06. විශ්‍රාම ගැනීම නිසා නදුනිට ගෙවිය යුතු මුළු මුදලම ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

07. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 4,500,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ,

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුන් ට්‍රේඩින් හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

## අභ්‍යාසය 133

සුනිල්, විනිල් සහ රනිල්, සුවිර මෝටර්ස් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන අතර, ලාභා'ලාභ පිළිවෙලින් 2:1:1 අනුපාතය යටතේ බෙදාගනු ලබයි.

(1) ඔවුන්ගේ හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි අන්තර්ගත වේ.

- සුනිල්, රු. 30,000/- බැගින් මාසික වේතනයක් ලැබීමට හිමිකම් ලබයි.
- ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වර්ෂයකට 10% බැගින් වූ පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.

(2) 2019 මාර්තු 31 දිනට සුවිර මෝටර්ස් හි ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටාගෙන ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| **සුනිල්** | | 1,500 |
| **විනිල්** | | 1,000 |
| **රනිල්** | | 500 |
| 2018 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම | | |
| **සුනිල්** | 365 | |
| **විනිල්** | | 288 |
| **රනිල්** | 350 | |
| හවුල්කරුවන්ගේ ගැනිලි | | |
| **විනිල්** | 80 | |
| **රනිල්** | 60 | |

(3) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර හවුල් වයාපාරයේ ශුද්ධ ලාභය රු. 874,000/- ක් විය.

(4) 2019 මාර්තු 31 දින, හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට රනිල් තීරණය කරන ලදී. 2019 මාර්තු 31 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 3,000,000/- ක් ලෙස අගය කරන ලද අතර, එම වටිනාකම කීර්තිනාම ගිණුමක් පවත්වා නොගෙන හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීමට තීරණය කරන ලදී.

(5) රනිල්ගේ විශ්‍රාම ගැනීමෙන් අනුතුරුව, සුනිල් සහ විනිල් අතර ලාභා'ලාභ පිළිවෙලින් 2:1 අනුපාතය යටතේ බෙදා ගැනීමට තීරණය කරන ලදී.

(6) රනිල්ගේ විශ්‍රාම යාමෙන් පසු ඔහුට ගෙවිය යුතු මුළු මුදලම ණය ගිණුමකට මාරු කිරීමට තීරණය කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ,

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සුවිර මෝටර්ස් හි, පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 06)

(මුළු ලකුණු 10)

**(AAT - July 2019)**

## අභ්‍යාසය 134

MA හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන මනු සහ අනු, ලාභා'ලාභ පිළිවෙලින් 3:1 අනුපාතයට ඔවුන් අතර බෙදා ගනිති. 2016 අප්‍රේල් 01 දින පහත කොන්දේසි යටතේ හවුල්කරුවෙකු වශයෙන් දනු ඇතුළත් කර ගැනීමටත් MAD පාර්ට්නර්ස් නමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමටත් ඔවුහු එකඟ වූහ.

(1) මනු, අනු සහ දනු අතර පිළිවෙලින්, 5:3:2 අනුපාතයට ලාභා'ලාභ බෙදාගත යුතු වේ.

(2) ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත වාර්ෂිකව 12% ක පොලියක් ප්‍රාග්ධනය මත ගෙවිය යුතුය.

(3) මනු, රු. 30,000/- ක මාසික වැටුපකට හිමිකම් ලබයි.

2017 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදී.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| මනු | | 8,000,000 |
| අනු | | 4,000,000 |
| දනු | | 6,000,000 |
| 2016 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම | | |
| මනු | | 1,000,000 |

| | | |
|---|---|---|
| අනු | 400,000 | |
| වර්ෂය තුළදී ගැනිලි | | |
| මනූ | 300,000 | |
| අනු | 200,000 | |
| දනු | 100,000 | |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 3,000,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ,

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ඒඃ පාට්නර්ස් හවුල් ව්‍යාපාරයේ සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම් (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 06)

(මුළු ලකුණු 10)

**(AAT - January 2018)**

## අභ්‍යාසය 135

ලාභා'ලාභ පිළිවෙලින් 2:1 අනුපාතයට බෙදා ගනිමින් බ්‍රයිට් ලයිට්ස් නම යටතේ සන් සහ මූන් හවුල් ව්‍යාපාරයක නිරතව සිටියහ.

2018 අප්‍රේල් 01 දක්වා හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් සන් විසින් කළමනාකරණය කරන ලදී. එදින සිට සන් හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, 2018 අප්‍රේල් 01 දින සිට ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය වෙනස්කොට එම කාර්යභාරය බාර ගැනීමට මූන් එකඟ විය.

සන් සහ මූන් අතර ඉහත කී වෙනස්කිරීම් සිදුකිරීම සඳහා පහත සඳහන් දෑ සම්බන්ධයෙන් ඔවුහු එකඟ වූහ.

(1) 2018 අප්‍රේල් 01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 3,000,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් පවත්වා නොගෙන හවුල්කරුවෙන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ඒ සඳහා ගැලපීම් කිරීම.

(2) සන් සහ මූන් අතර ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙලින් 1:2 ලෙස වෙනස් කිරීම.

(3) රු. 2,000,000/- කට අගය කරන ලද මූන්ගේ පෞද්ගලික වෑන් රථය හවුල් ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය ලෙස 2018 අප්‍රේල් 01 දින ඔහු විසින් මාරු කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ,

2018 අප්‍රේල් 01 දිනට සිදුවූ ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන් පිළියෙල කරන්න.

(ලකුණු 05)

**(AAT - July 2018)**

## අභ්‍යාසය 136

රෂ්මි, පුෂ්මමි සහ කුෂ්මි විසින් මිමි කලෙක්ෂන්ස්හි නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුළත් වේ.

- හවුල්කරුවන් ඔවුන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත, වාර්ෂිකව 6% බැගින් වූ ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හිමිකම් ලබයි.
- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සහභාගිවීම වෙනුවෙන් පුෂ්මි සහ කුෂ්මි එක් අයෙකුට රු. 35,000/- බැගින් වූ මාසික වේතනයක් ලැබීමට හිමිකම් ලබයි.
- රෂ්මි, පුෂ්මි සහ කුෂ්මි අතර ලාභා'ලාභ පිළිවෙලින් 3:1:1 යන අනුපාතයට බෙදාගනු ලැබේ.

(2) 2018 මාර්තු 31 දිනට මිමි කලෙක්ෂන්ස් හි ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| **රශ්මි** | | 1,500 |
| **පුෂ්මි** | | 500 |
| **කුෂ්මි** | | 500 |
| 2017 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම | | |
| **රශ්මි** | 65 | |
| **පුෂ්මි** | | 5 |
| **කුෂ්මි** | 50 | |

(3) පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

- 2018 මර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර වයාපාරයේ ශුද්ධ ලාභය රු. 1,490,000/- කි.
- 2018 මාර්තු 31 දින, හවුල්කරුවන් ව්‍යාපාරයේ කළමනාකාරීත්ව කටයුතු කෙරෙහි දක්වන දායකත්වය අනුව ලාභ බෙදාගන්නා අනුපාතය රෂ්මි, පුෂ්මි සහ කුෂ්මි අතර පිළිවෙලින් 2:1:1 ලෙස වෙනස් කිරීමට ඔවුන් විසින් තීරණය කරන ලදී.
- එදිනම, ඔවුන් විසින් හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,000,000/- ක් ලෙස අගය කරනු ලැබූ අතර, කීර්තිනාම ගිණුමක් විවෘත නොකොට, කීර්තිනාමය, හවුල්කරුවන්ගේ ප්‍රාග ්ධන ගිණුම් හරහා ගැලපීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

මිමි කලෙක්ෂන්ස් හි, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ඉහත ගනුදෙනු වාර්තා කිරීමට පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**(AAT - January 2019)**

## අභ්‍යාසය 137

ගයේෂා සහ නිමේෂා, ෂා ෂා පාර්ට්නර්ස් හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදාගන්නා හවුල්කරුවන් වේ. 2016 ජනවාරි 01 දින පහත සඳහන් කොන්දේසි යටතේ අධීෂා හවුල්කරුවෙක් ලෙස ඇතුළත් කරගනු ලැබුවා ය.

(1) පහත සඳහන් වාර්ෂික වැටුප් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
ගයේෂා : රු. 360,000/-
නිමේෂා : රු. 120,000/-
අධීෂා : රු. 800,000/-

(2) වර්ෂයකට 5% බැගින් ප්‍රාග්ධනය මත පොලී ලැබීමට හවුල්කරුවන්, හිමිකම් ලබයි.

(3) හවුල්කරුවන් අතර ලාභා'ලාභ සමසේ බෙදාගත යුතු යි.

(4) 2016 ජනවාරි 01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2,400,000/- කට අගය කළ යුතු අතර, කීර්තිනාම ගිණුමක් විවෘත නොකොට එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපිය යුතු ය.

(5) 2016 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී.

(රු. '000)

| | හර | බැර |
|---|---|---|
| 2016 ජනවාරි 01 අධීෂා රැගෙන ආ ප්‍රාග්ධනය | | 3,600 |
| 2016 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| ගයේෂා | | 40,000 |
| නිමේෂා | | 20,000 |
| 2016 ජනවාරි 01 දිනට ජංගම ගිණුම්: | | |
| ගයේෂා | | 10,000 |
| නිමේෂා | 6,000 | |
| වර්ෂය තුළ ගැනිලි: | | |
| ගයේෂා | 1,500 | |
| නිමේෂා | 1,000 | |
| අධීෂා | 600 | |

(6) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 20,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ෂා ෂා පාට්නර්ස් හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 03)

(c) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**(AAT - July 2017)**

## අභ්‍යාසය 138

**අමල්**, **කමල්** සහ **නිමල්** පිළිවෙලින් 2:2:1 අනුපාතයට ලාභා'ලාභ බෙදාගනිමින් හවුල් වයාපාරයක යෙදී සිටී.

හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුළත් වේ.

(1) හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වර්ෂයකට 10% බැගින් ප්‍රාග්ධනය මත පොලී ගෙවනු ලැබේ.

(2) පහත සඳහන් වැටුප් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.

කමල් - මාසිකව රු. 60,000/- බැගින්

නිමල් - මාසිකව රු. 25,000/- බැගින්

(3) පහත සඳහන් ශේෂ, 2018 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් උපුටාගෙන ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් - 2017 අප්‍රේල් 01 දිනට | | |
| **අමල්** | | 2,000 |
| **කමල්** | | 2,000 |
| **නිමල්** | | 1,000 |
| වර්ෂය තුළ ගැනිලි | | |
| **අමල්** | 800 | |
| **කමල්** | 600 | |

(4) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 2,329,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ,

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - July 2018)**

## අභ්‍යාසය 139

**අශාන්, හෂාන්** සහ **රොෂාන්**, 'ද ශාන්ස්', හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ අතර පිළිවෙළින් 2:2:1 අනුපාතයට ලාභා'ලාභ බෙදාගනු ලැබේ.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කරුණු ඇතුලත් විය.

- හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත වාර්ෂිකව 5% බැගින් වූ ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකම ඇත.
- රු. 15,000/- බැගින් වූ මාසික වැටුපක් ලැබීමට හෂාන් ට, හිමිකම ඇත.

(2) 2018 මාර්තු 31 දින, රොෂාන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, අශාන් සහ හෂාන් පහත සඳහන් කොන්දේසිවලට එකඟ විය.

- 2018 මාර්තු 31 දිනට, හවුල්ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,800,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් භාවිත නොකොට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ඒ සඳහා ගැලපීම් කළ යුතු වේ.
- 2018 මාර්තු 31 දිනට, ඉඩම සහ ගොඩනැගිලි පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

| | 2018 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණනය කළ අගය | පිරිවැය | 2018 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 2,400 | 1,800 | 300 |

ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණිත අගයට පවත්වාගෙන යනු ලැබේ.

- රොෂාන් වෙත ගෙවිය යුතු මුළු මුදල ඔහු විශ්‍රාම ගැනීමෙන් මසකට පසු සම්පූර්ණයෙන්ම පියවා දැමිය යුතුය.
- අශන් සහ හෂාන් අතර ලාභා'ලාභ, පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදාගත යුතුය.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර, හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 2,500,000/- ක් විය.

(4) 2018 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් | | |
| **අශාන්** | | 5,000 |
| **හෂාන්** | | 3,000 |
| **රොෂාන්** | | 2,000 |
| 2017 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් | | |
| **අශාන්** | | 500 |
| **හෂාන්** | | 300 |
| **රොෂාන්** | 200 | |

ඔබ විසින් කළ යුතු දෑ,

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 'ද ශාන්ස්' හවුල් ව්‍යාපාරයේ ඉහත ගනුදෙනු සටහන් කිරීමට පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 03)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**(AAT - July 2018)**

## අභ්‍යාසය 140

03. **අශාන්, හෂාන්** සහ **රොෂාන්** ලාභාලාභ පිළිවෙලින් 4 : 3 : 3 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යයි.

හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- ගැනිලි සඳහා වාර්ෂිකව 12% බැගින් පොලිය අයකරයි.
- ජංගම ගිණුම් ශේෂ මත පොලිය ගෙවීම හෝ අයකිරීම සිදු නොකරයි.
- රු. 125,000/- ක වාර්ෂික වැටුපකට හෂාන් හිමිකම් ලබයි.

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

(1) 2016 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත ශේෂ උපුටාගෙන ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2015 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම | | |
| අශාන් | | 2,000 |
| හෂාන් | 800 | |
| හවුල්කරුවන්ගේ ගැනිලි: | | |
| අශාන් 2015 අප්‍රේල් 01 දින | 1,000 | |
| රොෂාන් 2015 ඔක්තෝම්බර් 01 දින | 500 | |

(2) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 3,500,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - January 2017)**

## අභ්‍යාසය 141

අනුර, බිනුර සහ විනුර ලාභා'ලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක නිරතව සිටියහ.

හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුළත් ය.

- එක් එක් ගිණුම් වර්ෂය ආරම්භයේ දී හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල පවතින ශේෂයන් මත, වර්ෂයකට 5% බැගින් වූ ප්‍රාග්ධන පොලියකට හවුල්කරුවන් විසින් හිමිකම් ලබයි.
- බිනුර වර්ෂයකට රු. 75,000/- බැගින් වූ වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

2015 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන සහ ජංගම ගිණුමේ ශේෂ පහත සඳහන් පරිදි විය.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්: | | |
| අනුර | | 4,000 |
| බිනුර | | 2,400 |
| විනුර | | 1,800 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| අනුර | | 230 |

| | | |
|---|---|---|
| බිනුර | | 160 |
| විනුර | 50 | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2016 මාර්තු 31 දින විනුර හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, ඉතිරි හවුල්කරුවන් පහත සඳහන් කොන්දේසිවලට එකඟ විය.

- ලාභා'ලාභ සමසේ බෙදා ගත යුතු වේ.
- ප්‍රාග්ධනය මත පොලියත් බිනුරගේ වැටුපත් කිසිදු වෙනසක් නොකර, පෙර ගිවිසුමේ තිබූ ආකාරයට ම ගෙවිය යුතු විය.
- කීර්තිනාමය රු. 1,000,000/- ක් ලෙස අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් ඇති නොකොට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා එය ගැලපිය යුතු විය.
- 2016 මාර්තු 31 දිනට ජංගම නොවන වත්කම් පහත දැක්වෙන පරිදි ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර විස්තර පහත පරිදි වේ.

| | 2016 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණන අගය (රු) | පිරිවැය (රු) | 2016 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය (රු) |
|---|---|---|---|
| ඉඩම | 3,200,000 | 3,000,000 | - |
| ගොඩනැගිල්ල | 4,250,000 | 4,500,000 | 1,000,000 |
| පිරියත | 1,000,000 | 2,500,000 | 1,250,000 |

- ජංගම නොවන වත්කම් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණනය කළ අගයන්වලට පවත්වාගෙන යනු ලැබේ.
- විශ්‍රාම ගන්නා හවුල්කරුට ගෙවිය යුතු මුළු මුදල හවුල් ව්‍යාපාරයට දුන් ණය මුදලක් ලෙස හවුල් ව්‍යාපාරයේ තබා ගැනේ.

(2) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය (විසර්ජනය කිරීමට පෙර) රු. 500,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ,

2016 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයට, පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්,

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 10)

**(AAT - July 2016)**

## අභ්‍යාසය 142

පහත දැක්වෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ගයාන් සහ මධුසංක හවුල් ව්‍යාපාරයේ වන අතර, ඔවුන් ලාභ සහ අලාභ 5:3 අනුපාතයට බෙදා ගනු ලබයි.

2016.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| වත්කම් | පිරිවැය | සමු. ක්ෂය | ශුද්ධ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | | |
| ඉඩම් | 800,000 | - | 800,000 |
| ගොඩනැගිලි | 900,000 | 150,000 | 750,000 |
| පිරියත හා යන්ත්‍ර | 600,000 | 200,000 | 400,000 |
| | 2,300,000 | 350,000 | 1,950,000 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 200,000 | |
| ණයගැතියෝ | | 150,000 | |
| මුදල් | | 300,000 | 650,000 |
| **මුළු වත්කම්** | | | **2,600,000** |
| | | | |
| **හිමිකම හා වගකීම්** | | | |
| **හිමිකම** | | | |
| ප්‍රාග්ධන ගිණුම් - ගයාන් | | 1,250,000 | |
| - මධුසංක | | 750,000 | 2,000,000 |
| ජංගම ගිණුම් - ගයාන් | | 250,000 | |
| - මධුසංක | | 150,000 | 400,000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 200,000 | |
| | | | 2,600,000 |

මෙම දිනයේ දී, පහත කොන්දේසි යටතේ රංගිකා නව හවුල්කරුවෙකු ලෙස ඇතුළත් වන ලදී.

(1) හවුල්කරුවන් අතර ලාභ අලාභ බෙදා ගැනීමේ නව අනුපාතය 2:2:1

(2) වත්කම් පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

(i) ඉඩම් රු. 1,350.000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ii) ගොඩනැගිලි 10% අගයකින් වැඩි වූ අතර පිරියත හා යන්ත්‍ර අගය 20% කින් අඩු විය.

(iii) අඩමාන ණය සඳහා වෙන් කිරීම ණයගැතියන් මත 10% කින් සිදු කළ යුතු අතර තොග යේ වටිනාකමෙහි කිසිදු වෙනසක් සිදු නොවුණි.

(iv) රු. 10,000 ක් වටිනා උපකරණ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාගත නොවූ) පොත්වලට ගත යුතු ය.

(3) රු. 20,000 ක ණයහිමියෙකු ඔහුගේ මුදල්වලට හිමිකම් නොකියන අතර එය ලියා හැරිය යුතුය.

ඔබ විසින් ජර්නල් සටහන් වාර්තා කළ යුතු ය.

## අභ්‍යාසය 143

විරාජ්, රංග සහ ඉන්දික ලාභ සහ අලාභ සමසේ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නියැලී සිටියහ. 2015 මාර්තු 31 දින ඉන්දික හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදී.

(1) 2015 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ පොත්වලින් පහත ශේෂ උපුටා ගන්නා ලදී. පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

| දේපළ, පිරියත හා උපකරණ | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) |
|---|---|---|
| ඉඩම | 2,300,000 | |
| ගොඩනැගිලි | 1,575,000 | 393,000 |
| මෝටර් වාහනය | 2,500,000 | 1,000,000 |

| ශේෂ | විරාජ් | රංග | ඉන්දික |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම (බැර) (රු.) | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| ජංගම ගිණුම (හර) (රු.) | 50,000 | 25,000 | 30,000 |

2) විශ්‍රාම ගන්නා දිනට වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද අතර ප්‍රත්‍යාගණිත අගයන් පහත සඳහන් පරිදි විය.

| | |
|---|---|
| ඉඩම් | රු. 2,950,000/- |
| ගොඩනැගිලි | රු. 1,700,000/- |
| මෝටර් වාහනය | රු. 1,250,000 |

3) 2015 මාර්තු 31 දිනට කීර්තිනාමය රු. 600,000 ක් ලෙස ඇගයීම් කරන ලදී. කීර්තිනාමය ඉන්දික සඳහා ගෙවිය යුතු ප්‍රමාණය ගණනය කිරීම සඳහා පමණක් සළකා බැලීමට ද ගිණුම් පොත්වල පෙන්නුම් නොකිරීමට ද හවුල්කරුවෝ තීරණය කළහ.

4) ඉන්දිකගේ විශ්‍රාම ගැනීමෙන් පසු ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය විරාජ් සහ රංග අතර, පිළිවෙලින් 3 : 2 ලෙස වෙනස් කිරීමට ද තීරණය කරන ලදී.

5) හවුල් ව්‍යාපාර ගිවිසුමේ සඳහන් පරිදි විශ්‍රාම ගන්නා හවුල්කරුවගේ ප්‍රාග්ධන කොටස මත පොලී නොගෙවනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ,

2015 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් පිළියෙල කරන්න. (ලකුණු 05)

**(AAT - January 2016)**